# ක්‍රිස්තුස් වහන්සේගේ

# ප්‍රේම මග දූතයා

"මැරුණොත්, ඒ ඇර මළවුන්ගෙන් නැගිටුවනු ලැබූවෙත් දෙවියන් වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස් වහන්සේය." (රෝම 8:34)

76 වන වෙළුම අංක 04 (904) 2017 අප්‍රේල්


# නිරතුරුවම ජීවමානව සිටින අපගේ මැදහත්කරුවාණෝ


චාර්ල්ස් එච්. ස්පර්ජන් විසිනි


**"එබැවින් උන්වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහන්සේට පුළුවන."** (හෙබ්‍රෙව් 7:25)

උන්වහන්සේ නිරතුරුවම අප උදෙසා මැදහත්කම් කරන සේකැයි එහි පවසන්නේය. ක්‍රිස්තුස් වහන්සේගේ සදාකාලික පැවැත්ම තුළ උන්වහන්සේගේ සෙනඟ උදෙසා උන්වහන්සේගේ සීමා රහිත බව කෙළවරක් නොමැති බව පවතින සේක. උන්වහන්සේ මට ප්‍රේමකොට මා උදෙසා උන්වහන්සේගේ ජීවිතය පූජා කළ සේක. ක්‍රිස්තුස් වහන්සේගේ කෙළවරක් නොමැති ජීවිතය තුළින් අපට ලබාදෙන අදහස් කුමක්ද ? උන්වහන්සේ සීමාරහිතව අප උදෙසා ජීවමානව සිටින අතර අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම උන්වහන්සේ උදෙසා ජීවත්වීමට ඉඩ හැරිය යුතු බවයි.

ජීවමාන ක්‍රිස්තුස් වහන්සේගේ මෙම සත්‍යතාවය මතක තබා ගැනීම අපෙග් මහත් වූ අවශ්‍යතාවයයි. ප්‍රිය මිත්‍රවැරනි, සර්ව බලධාරී සහ දිව්‍යමය වූ තැනැන්වහ්සේ අපගේ උසස් වූ ආශිර්වාදය උදෙසා සැමදාම ජීවමානව සිටින සේක. උන්වහන්සේගේ දැඩි ආදරයට අපි මහත් ලෙස ඉඩ හරිමු. මෙහිදී ගැලවුම්කරුවාණන් අපගේ අවශ්‍යතාවයන් උදෙසා මැදහත්කාරකම් කිරීම කොපමණ මහත් ලෙස අවශ්‍යව තිබෙනවාදැයි පෙනෙන්නේය. ගැලවුම්කරුවාණන්ගේ මරණය පමණක් ඊට ප්‍රමාණවත් නොවේ. අපගේ ආත්ම උදෙසා සෑම මොහොතකම අපගේ ගැලවුම්කරුවාණන් ජීවමානව සිටීම සියලු ක්‍රියාමාර්ගවල දී අප වෙනුවෙන් මැදහත්කාරකම් කිරීමත් සියලු නපුරෙන් අපව මුදා ගැනීමත් අවශ්‍යව තිබේ. මේ පැයේ දී තිබෙන්නා වූ අපගේ අවශ්‍යතාවයේ දී වුවත් යේසුස් වහන්සේ නිරතුරුවම අපව ආරක්ෂා කරන සේක. උන්වහන්සේ කිසි විටෙක අනවශ්‍ය ආකාරයෙන් ක්‍රියා නොකරන සේක. මෙහිදී අපගේ මහත් වූ සැනසිල්ල පවතින්නේය. මෙම සත්‍යතාවයෙන් අප බැහැරව සිටින විට අපගේ දැඩි වූ පීඩනකාරී තත්ත්වය අපගේම කරමත පැටවී තිබේ. යේසුස් වහන්සේ ජීවමානව සිටින සේක. මාගේ බලවත් වූ මිදුම්කරුවාණෝ මා උදෙසා ජීවමානව සිටින සේක. උන්වහන්සේ සියලු බලයෙන් පූර්ණව සිටින සේක. උන්වහන්සේ සෑම අකාරයෙන්ම කැපවී සිටින සේක. උන්වහන්සේ සියලු රෝගවලින් මාව සුරක්ෂිතව තබාගන්නා සේක. මට මේ තුළ රැඳී නොසිටීමට පුළුවන්ද ? කිසිවකට මම භයවිය යුතුද.. ? අන්තරායෙන් මාව ආරක්ෂා කිරීම උදෙසා මට අවශ්‍ය ශක්තිය ලබාදීමට උන්වහන්සේ කැපවී නොමැති සේක්ද ... ? යේසුස් වහන්සේ බලයෙන් පූර්ණව සදාකාලයටම සිටින නිසා අප්‍රමාණ වූ ආශිර්වාද උන්වහන්සේ මත රැඳී සිටින අයට ලබා ගැනීමට පුළුවන.

ප්‍රේමවන්තයෙනි, මෙහි අපගේ සැනසිල්ල ඇත්තේය. අපට ඇත්තේ එක් පූජකයෙක් පමණි. උන්වහන්සේ සදාකාලයටම සිටින සේක. උන්වහන්සේට ප්‍රථමයෙන් කිසිවෙක් සිටියේ නැත. උන්වහන්සේට සමාන කිසිවෙක් ද නැත. මක්නිසාද අප වෙනුවෙන් උත්තම පූජකයාගේ කාර්යභාරය සදාකාලයටම උන්වහන්සේ ඉටුකරන සේක. මාගේ ආත්මය වෙන කිසිවෙක් මත නොව උන්වහන්සේගේ පූජාවීම මත ඇදහිල්ලෙන් රඳවා තබා ගනිමි. උන්වහන්සේ එක වරක් තමන් වහන්සේගේම ජීවිතය පූජා කරමින් සදාකාලයටම සරිලන පූජාව කළ සේක. වෙන කිසිවෙකු එසේ කිරීමට නොහැකි විය. යේසුස් වහන්සේ අපගේ හදවත්වල ශබ්දය නිරතුරුවම ඇහුම්කන් දෙමින් අපගේ හදවත්වල තිබෙන දේ කියවන සේක. උන්වහන්සේ මාගේ සියලු වේදනාවන් දන්නා සේක. මම මගේ වේදනාවන් උසුලා දරා සිටින විට සහ මගේ ශක්තිය හීනවී තිබෙන විට යන අවස්ථා දෙකේදීම උන්වහන්සේ මාගේ වේදනාවන් දරාගන්නා සේක. අපි සම්පූර්ණයෙන්ම අක්‍රීය තත්ත්වයට පත්ව සිටින විටදී වුවත් උන්වහන්සේ අක්‍රීය නොවන සේක. එම නිසා උන්වහන්සේගේ අවසන් නොවන ආශිර්වාදය පිළිගැනීමට සූදානම්ව සිටිමි. ක්‍රිස්තුස් වහන්සේගේ නොබිඳුනාවූ සදාකාලික පූජකත්වය ගැන අපි ප්‍රීතිමත් නොවන්නේද ........?

## ස්ථිර මැදහත්කරුවෙකුවීමේ අවශ්‍යතාවය

අපි අපගේ පාපිෂ්ඨ ස්වභාවයන්වල සහ දුර්වලකම්වල යෙදී සිටින අතර යේසුස් වහන්සේ අප උදෙසා නිරන්තරයෙන් ආයාචනා කිරීම කරුණුකොටගෙන නොකඩවා අපගේ සුරක්ෂිතභාවය බලාපොරොත්තු විය හැකිද .. ? ලෝකය පාපිෂ්ඨව, කළහකාරී ක්‍රියාමාර්ගවලින් යුක්තව පවතින්නේය. අපි බොහෝ නිදැල්ලේ ගමන් කරන්නෙමු. අපගේ අවශ්‍යතාවයන් නිරන්තරයෙන් පවතින්නේය. එබැවින් අපට සදාකාලික මැදහත්කරුවෙක් අවශ්‍යව තිබේ. අනතුරුදායක තත්ත්වය අපෙන් පහවයන්නේ නැත. එබැවින් සැමවිටම අපේ ආරක්ෂකයාණන්ගේ යාච්ඤා කිරීම අපට අවශ්‍යව තිබේ. වෙනකවදාවත් නොවූ ලෙස අපගේ දුර්වලකම් සහ අනුවණකම් පවතින බැවින් අපගේ ආරක්ෂකයාණන්ගේ නිරන්තර අනුග්‍රහය ඉල්ලා සිටිමු. ඔබ අතරේ අවශ්‍යතාවයන් සම්පූර්ණ විය යුතු නොවන්නේ කොයි මනුෂ්‍යයාටද ? දවසේ විවිධ වූ අවස්ථාවල දී දෙවියන් වහන්සේගේ කරුණාවේ. සිංහාසනය වෙතට ළඟාවීමට අවශ්‍ය නොවන්නේ කොයි මනුෂ්‍යයාටද ? යේසුස් වහ්න්සේ නිරන්තරයෙන් එහි සිටින සේක. අපි ආයාචනා කිරීම මත රැඳී සිටිමු. උන්වහන්සේ අපගේ පුද්ගලිකත්වයත්, ආයාචනා කිරීමත්, දෙවියන් වහන්සේ සමඟ පිළිගැනීමත් සඳහා අපව පිළියෙල කරන සේක. සහෝදරයෙනි, අපි දවස්පතා පීඩනය තුළ සිටින්නෙමු. පාපයට ආවේණික වරදකරුවන් වී සිටින්නෙමු. එසේ නැති නම් ශාරීරිකව දුක්විඳිමින් සිටින්නෙමු. අපගේ සහෝදරයන් උදෙසා හෝ අපගේ ස්වාමීන් වහන්සේගේ රාජ්‍යය උදෙසා කරන්නා වූ සේවයේ දී අනුකම්පාව ශුද්ධස්ථානයෙන් අපට උපකාර අවශ්‍යවී තිබේ. ස්වර්ගීය කරුණාවේ සිංහාසනය කරුණු කොටගෙන පමණක් උපකාරය පැමිණීමට පුළුවන්වේ. අපගේ බර උසුලාගෙන යාමේ දී, අපේ බර බිම තබන්නැයි යම් කෙනෙක් කියද්දී, අපගේ වේදනාව ගැන යම් කෙනෙක් කියන දේ අපේ කන්වලට ඇසෙද්දී අප උදෙසා මැදහත්කාරකම් කිරීමට කෙනෙක් අවශ්‍ය වේ. යේසුස් වහන්සේ නිරන්තරයෙන්ම අප උදෙසා මැදහත්කාරකම් කරන සේක.

## අසීමිත වූ ආශිර්වාද

අපගේ වර්ධනය සහ ප්‍රයෝජනය උදෙසා අවශ්‍යව තිබෙන අනර්ඝ වූ දීමනා සහ කරුණාවත් අපගේ බලවත් වූ මැදහත්කරුවාණන් තුළ පවතින සේක. මේ ලෝකයේ සේවයේ ප්‍රයෝජනයට අවශ්‍ය අපගේ ආත්මික ජීවිතයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා උන්වහන්සේගේ දෑතේ උන්වහන්සේ අපව මෙහෙයවන සේක. මනුෂ්‍යයන්ව දේවරාජ්‍යයේ පංගුකාරයන් කිරීමට අපට ශක්තිය ලබාදෙන සේක. උසස් වූ ගුණයහපත්කම්වලට සමීපවීමෙන් ඇත්ව සිටින්නේ නම් දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට සියළු යහපත් ක්‍රියාවලින් අපව සම්පූර්ණ කිරීම වඩා වඩා අප වෙතට ගෙනඒම උන්වහන්සේගේ මැදහත්කාරකම් කිරීම අපට අභිමිවී යා හැකිය.

සතුරා වන සාතන් ක්‍රියාත්මකව පවතින බවත්. සතුරාගේ දුෂ්ඨ චේතනාවෙන් ද්වේශ කළ යුතු බවත් ඔබ අමතක කර තිබෙනවාද ? දෙවියන් වහන්සේ සහ අපගේ මැදහත්කරුවාණන් ඉදිරියේ සහෝදරයන්ට වරද තබන්නා සහ ඔහුගේ ක්‍රියාවන් නොපවතින අතර සියොන් වෙත සහ අප වෙත උන්වහන්සේගේ සමාදානය නොපැවතීමට හේතුව කුමක්ද ... ? සාතන් මෙම වරද තැබීමෙන් අපව පරාජයට පත්කර අවබෝධ කර ගැනීමට අපහසු උගුල් අටවා තිබෙන්නේය. ප්‍රේතුැස්ගේ අවස්ථාවේ මෙම සත්‍යතාවය අපට පැහැදිලිව පෙනෙන්නේය. **සීමොන් ...., සීමොන්,..., බලව නුඹලා ගෝධුම මෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. නමුත් නුඹේ ඇදහිල්ල නැති නොවන පිනිස නුඹලා උදෙසා මම යාච්ඤා කළෙමි. නුඹ නැවත හැරුණායින් පසු නුඹේ සහෝදරයන් ස්ථිර කර පන්නැයි කී සේක.** (ලූක් 22:31-32) යේසුස් වහන්සේගේ යාච්ඤා කිරීම කරුණුකොටගෙන නිරතුරුවම සාතන්ගෙන් සඟවා තබා ආරක්ෂා කරන සේක. අපගේ ස්වාමීන් වහන්සේගේ මැදහත්කාරකම් කිරීමේ පළිහ කරුණුකොට ගෙන සාතන්ගේ විෂ ඊතල වළක්වා අපව ආරක්ෂා කරන්නේ කෙසේදැයි අපි අවබෝධ කරගෙන නොමැත. ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම්


2 පිටුවට


"නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයිදෙයක් වුවත් පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ඨකරන්නෙමි" (යොහාන් 14:13)

1 පිටුවෙන්

## නිරතුරුවම ජීවමානව සිටින...

කිරීමත් සමඟ දස දහස් ගණන් දෑත් වලින් නිරතුරුවම ආශිර්වාදය විසිරුවා හරින සේක.

දෙවියන් වහන්සේ මෙසේ අසන සේක. **නුඹ මුහුදේ උල්පත් ළඟට පැමිණියෙහිද ... ? නොහොත් ගැඹුරේ රහස් තැන්වල ඇවිද්දෙහිද ?** (යෝබ් 38:16) නිශ්චිතවම අපගේ ස්වාමීන් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම සාගරයේ පවතින උල්පත් මෙන් වන සේක. දෙවියන් වහන්සේගේ සෙනඟ වටකර කන්ද වටේට ගිණි අශ්වරථ සහ අශ්වයන්ගෙන් පිරී පවතින බව දැකීමට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අපගේ දෑස් විවෘත කරන සේක. මේ අශ්වයන්ව මෙහෙයවන්නේ කවුද .. ? මේ අශ්ව රථ හසුරුවන්නේ කවුද .. ? දෙවියන් වහන්සේ සෙනඟ වටකර සිටින ආත්ම සේනාවේ නියමුවා කවුද .. ? අප උදෙසා සියලු කාරණා සම්පාදනය කරන්නෙත් සියලු බලයෙන් පූර්ණව අප උදෙසා මැදහත්කාරකම් කරන්නෙත් උන්වහන්සේය.

ස්වාමී වූ යේසුස් වහන්සේගේ අඛණ්ඩව ආයාචනා කිරීම කරුණුකොටගෙන අන්ධකාරයේ සියලු බලය මැඩපවත්වා අපව මුදා හැනීම සඳහා ආලෝකයේ සියලු බලය වෙතට ගෙන එන සේක. උන්වහන්සේගේ මැදහත්කාරකම් කිරීම නිසා අපට ආශිර්වාදයේ වාතාවරණය තුළ ගමන් කිරීමට සහ ජීවත්වීමට හැකියාව ලබාදෙන සේක. අපගේ මැදහත්කරුවාණන් වෙහෙසට පත්නොවී අඛණ්ඩව අප ගැන කොපමණ ගැඹුරින් සැලකීමේ වගකීම දරා සිටිනවාද කියා අපි අවබෝධ කරගෙන නැත. අපට එය ගණන් කිරීමට ද නොහැකිය. සියලු ශුද්ධවන්තයන් මුදාගෙන සදාකාලයටම උචිත ලෙස නොකඩවා එය පවත්වා ගැනීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිරතුරුවම අප උදෙසා මැදහත්කාරකම් කිරීම් කරන සේක.

# අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම

**රීචි තාම්වෙල් විසිනි**

**"නමුත් මුන්වහන්සේ, සදාකාලේටම පවතින හෙයින්, උන්වහන්සේගේ පූජකකම පහවන්නේ නැත. එබැවින්, උන්වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟා වෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන "** (හෙබ්‍රෙව් 7:24-25)

පෙරමඟ දූතයා මෙම කලාපය අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම සහ ක්‍රිස්තුස් වහන්සේ තුළ සහ ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ මැදහත්කාරකම වෙනුවෙන් ඉලක්කවී ඇත. මෙම අදහස කල්පනාවේ තබාගෙන අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම පිළිබඳව අනර්ඝ වූ සත්‍යතාවයන් වෙතට මම ඔබගේ අවධානය රැගෙන යන්නෙමි. එයින් ඔබට මහත් ධෛර්යයක් ලැබෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

"අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම තුලින් අපට පැමිණෙන්නා වූ විපත්ති වලින් අපි අතිශයෙන් ජයගන්නෝ වමුව. "

අපගේ වාතාවරණයන් කොපමණ දරුණු වුවත් (බියකරු වුවත්) අපගේ සෝදිසි කිරීම් කොපමණ බලවත්ව තිබුණත් ප්‍රශ්ණයක් නැත. මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා මැදහත්කාරකම් කරන බැවින් ඒ සියලු කරදරවලින් උන්වහන්සේ තුළ අපි ජයගන්නෙමුව. උන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව වෙන් කිරීමට කිසි දෙයකට නුපුළුවන. අපෝස්තුළු පාවිලු රෝම යැවුම් පත්‍රයේ මෙසේ ලියා යැවීය. **"මැරුණොත් ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබූවෙත්, දෙවියන් වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙක් ක්‍රිස්තුස් වහන්සේය. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්නේ කවුද .. ? විපතවත්, සිත් වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන් කරන්නේද .. ? ඒ හැටියට දවස මුළුල්ලේ ඔබ නිසා අපි මරනු ලබමුව. මරණයට නියම කළ බැටළුවන් මෙන් ගණන් ගනු ලබුවෙමු යයි ලියා තිබේ. නුමුත් අපට ප්‍රේම කළා වූ තැනැන් වහන්සේ කරුණුකොට ගෙන අපි මේ සියල්ලේ දී අතිශයින්ම ජයගන්නෝ වමුව. මක්නිසාද මරණයටත්, ජීවනයටවත්, දූතයන්ටත්, අධිපතිකම්වලටවත්, දැන පවතින දේ වලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්, ගැඹුරටවත්, අන් කිසි මැවිල්ලකටවත්, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇත්තා වූ දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්ට නොහැකි වන්නේ යයි ඒකාන්තයෙන්ම දනිමි."** (රෝම 8:34-39)

ක්‍රිස්තුස් වහන්සේ දෙස බලා සිටින්නන්ගේ සියලු අවශ්‍යතාවයන් ලබාදීමට උන්වහන්සේ සැබවින්ම ප්‍රමාණවත්ව සිටින සේක. උන්වහන්සේ අප කෙරෙහි පත්ව සිටින ප්‍රත්‍රයෙකු මෙන් විශ්වාසව සිටින සේක. (හෙබ්‍රෙව් 3:6) උන්වහන්සේ අපගේ මහත් වූ එඬේරාණන් වන සේක. (හෙබ්‍රෙව් 13:20) උන්වහන්සේ අපගේ ඇදහිල්ලේ කතෘවරයා ද සම්පූර්ණ කරන්නා ද වන සේක. (හෙබ්‍රෙව් 12:1) උන්වහන්සේ වචනයේ බලය කරුණුකොටගෙන උන්වහන්සේ සියලු කාරණා දරා සිටින සේක. (හෙබ්‍රෙව් 1:3) සියලු ආකාරයෙන් අපව උසුලා සිටිමින් අපව පෝෂණය කිරීමට උන්වහන්සේට පුළුවන. ඔබගේ දුර්වලකම් හෝ අධෛර්යමත්කම් හෝ වේදනාවන් හෝ දුක්විඳීම හෝ අවශ්‍යතාවයන් හෝ පොරබැදීම් හෝ, මැදිවී සිටින කාරණාවන් හෝ මොනවා වුවත් උන්වහන්සේ ඔබගේ අවශ්‍යතාවයන් සපයා දෙන සේක. යේසුස් වහන්සේ අප වෙනුවෙන් උන්වහන්සේගේ ජීවිතය පූජා කළ සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම තුළින් අප සියලු පරීක්ෂාවලින් ජය ගන්නෙමුව.

ක්‍රිස්තුස් වහන්සේ මාංශාකාරයෙන් අපගේ ස්වභාවයට සම්පූර්ණයෙන්ම පංගුකාර වූ සේක. (හෙබ්‍රෙව් 2:14) පව් කිරීමක් නැතිව අප වාගේම සියලු ආකාරයෙන්ම පරීක්ෂා කරනු ලැබීමට ලක් වූ සේක. (හෙබ්‍රෙව් 4:15) සියලු කාරණාවලදී අපගේ ස්වභාවයට සමාන වූ සේක. **"එබැවින් සෙනගගේ පව් උදෙසා ශාන්ති පූජාවක් ඔප්පු කිරීමට දෙවියන් වහන්සේ පිළිබඳ කාරණා ගැන දයාවන්ත වූ විශ්වාස වූ උත්තම පූජකයෙක් වෙන පිණිස සියලු දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට සමානවෙන්ට උන්වහන්සේට යුතු වූයේය."** (හෙබ්‍රෙව් 2:17) අපගේ දුර්වලකම්වලදී අනුකම්පාව දක්වන සේක. (හෙබ්‍රෙව් 4:15) එමෙන්ම උන්වහන්සේ පරීක්ෂා කරනු ලැබ දුක්වින්ද බැවින් අප පරීක්ෂා කරනු ලබන විට අපට පිහිටවෙන්ට උන්වහන්සේට හැකිව සිටින සේක. (හෙබ්‍රෙව් 2:18) අපට උපකාර කිරීමට උන්වහන්සේට හැකිව සිටිනවා පමණක් නොව නමුත් අපට උපකාර කිරීමට ආශාවෙන් සහ ඒ සඳහා අපට ආරාධනා කරන සේක. **"එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වල දී අපට උපකාරයට අනුග්‍රහය සම්බවෙන පිණිස ද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු."** (හෙබ්‍රෙව් 4:16)

"ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම තුළ පාපයෙන් පවිත්‍රකර සමාව ලබාදෙනසේක. "

ලේ වැගිරීමක් නැතිව පාප කමාවක් නොමැත. (හෙබ්‍රෙව් 9:22) මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ ප්‍රජාව නිසා උන්වහන්සේගේ ලේ තුලින් දැන් අපගේ සියලු පාපවලින් අපව පවිත්‍ර කරනු ලැබ අපට සමාව ලබා දී තිබෙන සේක. අපෝස්තුළු යොහාන් මෙසේ ලියනු ලැබීය. **"නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නාසේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම් අපට එකිනෙකා සමඟ පංගුකාරකම ඇත්තේය. උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් වහන්සේගේ ලේ ද සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය. අපට පාපය නැතැයි කියමු නම් අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියා දෙමු නම් අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක."** (1 යොහාන් 1; 7-94:16) "මාගේ ප්‍රියදරුවෙනි, මේ කාරනා නුඹලාට ලියා එවන්නේ නුඹලා පව් නොකරන පිණිසය. යමෙක් පව් කළොත් ධර්මිෂ්ඨ වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වන මැදහත්කාරයෙක් පියාණන් වහන්සේ වෙත අපට සිටින සේක. උන්වහන්සේ අපේ පව් උදෙසා ශාන්තිකර පූජාවය, අපේ පව් උදෙසා පමණක් නොව මුළු ලෝකයාත් උදෙසාය. (1 යොහාන් 2; 1-2) යේසුස් වහන්සේට සම්පූර්ණයෙන්ම අපගේ පාපය සමඟ ගනුදෙණුකොට පාපයෙන් අපට ජය ලබාදීමට හැකිව සිටින සේක. ඔබට අවශ්‍ය කමාව ලබා ගැනීම සහ පවිත්‍රවීම උදෙසා උන්වහන්සේව සොයන්න. ඔබ පාපය සමඟ පොරබදන්නේ නම් සියලු පාපවලින් ජය ලබා ගැනීමට බලය සහ කරුණාව උදෙසා උන්වහන්සේ දෙස බලන්න. උන්වහන්සේ ශුද්ධතැනැන්වහන්සේ වන අතර අපව ශුද්ධකමට ගෙන ඒමට පිරිසිදු කරනු ලබන සේක. (හෙබ්‍රෙව් 2:11)

"ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම තුළ අපි නපුරාගෙන් ජයගන්නෝ වමුව."

නපුරාගෙන් අපව ආරක්ෂා කිරීම උදෙසා පියාණන් වහන්සේට යාච්ඤා කිරීම යේසුස් වහන්සේගේ යාච්ඤාවේ එක් අංගයක් වේ. (යොහාන් 17:15) ප්‍රේත්‍රුස් උදෙසා උන්වහන්සේගේ යාච්ඥා කිරීමෙන් උන්වහන්සේගේ හදවතින් සහ බලයෙන් සාතන්ගේ සියලුම පහරදීම් වලින් අපව ආරක්ෂා කරන බව අනාවරණය කරන සේක. "සීමොන් ..... සීමොන් .... බලව, නුඹලා ගෝධුම මෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. නුමුත් නුඹේ ඇදහිල්ල නැති නොවන පිණිස නුඹ උදෙසා මම යාච්ඥා කළෙමි. නුඹ නැවත හැරුණායින් පසු නුඹේ සහෝදරයන් ස්ථිර කරපන්නැයි කී සේක. " (ලූක් 22; 31-32) ස්වාමීන් වහන්සේ පාවුල්තුමාගේ වගකීම භාරගෙන තිබෙන්නේ කෙසේද කියා අපෝස්තුළු පාවුල් සාක්ෂි දරන්නේය. "නුමුත් මා කරුණුකොටගෙන පණිවිඩය සම්පූර්ණ ලෙස ප්‍රකාශ වන පිණිසත් එය සියලු අන්‍යජාතීන්ට අසන්ට ලැබෙන පිණිසත් ස්වාමීන් වහන්සේ මා ළඟ සිට මා ශක්තිමත් කළ සේක. මම සිංහයාගේ කටින් මුදනු ලැබීමි. ස්වාමීන් වහන්සේ හැම නපුරු වැඩවලින් මා මුදා ආරක්ෂාකොට තමන් වහන්සේගේ ස්වර්ග රාජ්‍යයට මා පමණුවන සේක. උන්වහනසේට සදාකාලයටම මහිමය වේවා.....! ආමේන් ......!" (2 තිමෝති 4:17-18)

යේසුස් වහන්සේ මාංශාකාරයෙන් අපගේ පංගුකාරත්වයට පැමිණි සේක. "එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එම ආකාරයෙන් එවාට

3 පිටුවට

"මැරෙන තරම් මාගේ ආත්මය ඉතා ශෝක සහිතය... නුඹලා මෙහි නැවතී මා සමඟ අවදිව සිටිල්ලා යයි කී සේක " (මතෙව් 26:38)

2 පිටුවෙන්

# අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ...

පංගුකාරයෙක් වූ සේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරුණුකොටගෙන බල නැතිකොට, ජීවිතය මුළුල්ලෙහි මරණයට බයින් වාල්කමට යටත්ව සිටි සියල්ලන් නිදහස් කරන පිණිසය. (හෙබ්‍රෙව් 2:14-15) සාතන්ට ඉහළින් සිට ජයග්‍රහණය ලබා ගැනීමට අපට පුළුන්කම ලබා දෙන සේක. උන්වහන්සේගේ මරණය කරුනුකොටගෙන ක්‍රියාකාරකමින් බයෙන් ජය ගැනීමට හැකියාව ලබාදෙන සේක. දැනුත් උන්වහන්සේ අප උදෙසා ක්‍රියා කරමින් සිටින සේක. **"නුඹලාට ඇති දෙයින් සතුටු වී වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටපල්ලා, මක්නිසාද මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි. කිසි ආන්දමකින්වත් නුඹ අත්නොහරිමියි උන්වහන්සේම කියා තිබේ. මෙසේ ස්වාමීන් වහන්සේ මාගේ උපකාරකාරයාණෝය. මම බය නොවන්නෙමි. මනුෂ්‍යයා මට කරන්නේ කුමක්ද ? කියා මහත් ධෛර්යයෙන් යුක්තව කියමුව"** (හෙබ්‍රෙව් 13-5:6) මේ සියලු දේවල් අපගේ කල්පනාවේ තබාගෙන මහත් වූ ඇදහිල්ලකින් අපට යාච්ඤා කළ හැකිය. **"අප පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් අප ගැළෙව්ව මැනව."** (මතෙව් 6:13)

"ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකම් කිරීම තුලින් අපව නිශ්චිතවම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළට ගෙන එන සේක."

අහස පසුකර ගියා වූ යේසුස් වහන්සේ අපගේ උත්තම පූජකයාවී සිටින සේක .(හෙබ්‍රෙව් 4:14) එමෙන්ම උන්වහන්සේ අප වෙනුවෙන් තිරයෙන් ඇතුළට යන්නාවූ නැංගුරුමක් මෙන් සිටින සේක. (හෙබ්‍රෙව් 6:19-20) උන්වහන්සේ සියලුදෙනා උදෙසා එකවරක් තමන් වහන්සේගේම ලේ ඇතිව අතිශුද්ධාස්ථානයට ඇතුල් වූ සේක. (හෙබ්‍රෙව් 9:12) අප වෙනුවෙන් දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ පෙනී සිටින සේක. (හෙබ්‍රෙව් 9:24) යේසුස් වහන්සේගේ ලේ සහ ශරීරය පූජා කිරීමෙන් අතිශුද්ධස්ථානයට ඇතුල්වීමට අළුත් වූ ජීවමාන මාර්යක් අපට සාදා දුන් සේක. (හෙබ්‍රෙව් 10:19-20) උන්වහන්සේගේ වර්තමාන සේවය අපට ඉහළින් උත්තම පූජකයෙක්ව ඇදහිල්ලේ සම්පූර්ණ සහතිකය තුළ හදවතේ සත්‍යතාවය සමඟ දෙවියන් වහන්සේ වෙතට ළඟාවීමට අපට හැකියාව ලබාදීම වන සේක. (හෙබ්‍රෙව් 10:21-22) කොපමණ ශුද්ධ වූ වරප්‍රසාදයක්ද .. ? ඇතිශුද්ධ ස්ථානයට ඇතුල්වීමේ ආශිර්වාදලත් ක්‍රියා මාර්යේ අවසානයට එය යෝග්‍ය වන්නේ යැයි ඇන්ඩෲ මරේ විස්තර කරන්නේය.

මෙහිදී පියාණන් වහන්සේගේ මුහුණ දකිමින් උන්වහන්සේගේ ප්‍රේමය අත්විඳින්නෝය. උන්වහන්සේගේ ශුද්ධකම අනාවරණය කරමින් ඊට පංගුකාරයන් කරගන්නා සේක. මෙහිදී ප්‍රේමයේ පූජාව තුළ නමස්කාරයත් දැඩි භක්තියත්, යාච්ඤා කිරීමේ සහ අයැද සිටීමේ සුවඳ දුම් ඔප්පු කිරීමත් තුළ බලය පවතින්නේය. එමෙන්ම මෙහිදී දෙවියන් වහන්සේගේ සිංහාසනයෙන් සහ බැටළු පැටවාණන් යටතේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම ගංගාවක් සේ උතුරාගලා යන බව අවබෝධ වන්නේය. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ මනුෂ්‍යයන්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ ඒකත්වය තුළ වර්ධනය වන අතර උන්වහන්සේගේ සමානත්වයට බොහෝ සෙයින් ළඟා වන්නෝය. ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක්සත්වීමෙන් උන්වහන්සේ තුළ පවතින අඛණ්ඩ මැදහත්කාරකම කරුණුකොටගෙන මැදහත්කාරකමේ අපගේ කාර්යභාරය ඉටු කිරීමට දිරිගන්වනු ලබන සේක. දෙවියන් වහන්සේගේ බලය සමඟ ජය ගැනීමට හැකි වේ. රාජාලියෙකුගේ මෙන් පියාපත් ඇතිව ශක්තිය අළුත් කරගෙන, ආශිර්වාදය, බලය සහ ප්‍රේමය සන්නිවේදනය කිරීමත් සමඟ දෙවියන් වහන්සේගේ පූජකයන්ට විනාශ වෙන ලෝකය වෙතට ආශිර්වාදය රැගෙන යාමට පුළුවන. සැමදාම අපි අළුත් ආලෝකයක් අත්දැකීම තුළ ගුණ යහපතකම් ඇතිව සාක්ෂිකාරයන් ලෙස පිටතට යා හැකිය. මනුෂ්‍යයන්ට දෙවියන් වහ්සේගේ ගැලවීම ප්‍රකාශ කරන්නා වූ මාධ්‍යය විය හැකිය. අපගේ ආශිර්වාදලත් රජතුමාගේ කාර්යයන් සම්පූර්ණ කිරීමට සහ අවසාන ජයග්‍රහණයට ජීවමාන මෙවලමක් විය හැකිය. අපගේ මහත් වූ උත්තම පූජකයා වන යේසුස් වහන්ස...., මෙය අපගේ ජීවිතවල ඉටු කළ මැනව.... !

# ක්‍රිස්තුස් වහන්සේ සමඟ යාච්ඤාවේ සටන තුළ සිටිමු!

**හෙන්රි බ්ලැකබේ විසින**

මතෙව් 26: 36-46 දක්වා පදවල ස්වාමී වූ යේසුස් වහන්සේ ගෙත්සෙමන උයනේදී උන්වහන්සේගේ ජීවිතයේ මහත් වූ සටන භාරගත්විට එය ඉතා සංවේදීව තිබූ බව අපි කියවන්නෙමු. යේසුස් වහන්සේ උන්වහන්සේ සමඟ ගෙත්සෙමන උයනට යාමට උන්වහන්සේගේ ගෝලයන්ටත් ආරාධනා කළ සේක. ඊළඟට ඔවුන් අතුරෙන් තුන් දෙනෙකුට උන්වහන්සේ සමඟ ගොස් උන්වහන්සේ මෙන් යාච්ඤා කිරීමට ආරාධනා කළ සේක. උන්වහන්සේ **"අවදිව සිට යාච්ඤා කරන්නැයි"** සාමාන්‍ය ආකාරයෙන් ඔවුන්ගෙන් ඉල්ලා සිටි සේක. අපගේ ස්වාමීන් වහන්සේගේ හදවතේ තිබුණා වූ දෙයට අපි විශේෂයෙන් අවධානය යොමුකරමින් දේව වචනයේ සදහන් දේ කියවමු.

**"එකල යේසුස් වහන්සේ ඔවුන් සමඟ ගෙත්සෙමනය කියන ස්ථානයට පැමිණ මා අතනට ගොස් යාච්ඤා කරන අතර නුඹලා මෙහි ඉඳිල්ලා යයි තමන් ගෝලයන්ට කී සේක. උන්වහන්සේ ප්‍රේත්‍රුස් ද, සෙබදිගේ පුත්‍රයන් දෙදෙනා ද කැඳවාගෙන ගොස් ශෝක වෙන්ටත් අතිශයින් කැළඹෙන්ටත් පටන්ගත් සේක."** (මතෙව් 26:36-37)

යේසුස් වහන්සේ තුළ යාච්ඤා කිරීමේ දී යේසුස් වහන්සේ තුළ තිබූ එම ප්‍රමාණයටම ඔබ යාච්ඤා කරනවාද..? එසේ යාච්ඤා කිරීමට පැමිණෙන විට දෙවියන් වහන්සේගේ හදවතේ තිබෙන්නේ කුමක්දැයි ඔබ අවබෝධ කරගන්නවා ඇත. ඔබ මුහුණ දී සිටින්නේ කුමකටදැයි තේරුම් ගන්න නමුත් වේදනාවට පත්නොවිය යුතුය. නමුත් අවදානමට ලක් වූ සහ ඔබගේ යාච්ඤා කිරීම නිරන්තරයෙන් වෙනස් කරගත යුතු ආකාරය කුමක්ද ? ඔබ යාච්ඤා කිරීමට ආරම්භ කරන විට ඔබ දැඩි වේදනාවෙන් සහ මහත් වූ අපහසුතාවයකින් සිටිනවා විය හැකිය. වෙනස් නොවී යේසුස් වහන්සේ සමඟ ගමන් කළ උන්වහන්සේගේ ගෝලයන් මෙන් සිටින තෙක් යාච්ඤා කිරීමේ දී මෙම ස්වභාවය අත්දකිනවා ඇත.

**"එකල උන්වහන්සේ ඔවුන්ට කථාකොට, මැරෙන තරම් මාගේ ආත්මය ඉතා ශෝක සහිතය. නුඹලා මෙහි නැවතී මා සමඟ අවදිව සිටපල්ලා යයි කී සේක."** (මතෙව් 26:38) ලෝකයේ බර උසුලාගෙන යන්නේ ඔබද නැති නම් යේසුස් වහන්සේද .. ? එය උසුලාගෙන යන්නේ යෙසුස් වහන්සේ වන සේක. එම නිසා මා විසින් ලියන ලද එක් පොතක මාතෘකාවට **"යේසුස් වහන්සේ සමඟ යාච්ඤා කිරීමේ අත්දැකීම"** කියා යෙදූවෙමි. යේසුස් වහන්සේගෙන් වෙන්ව සිටීම සුදුසු නොවේ. යේසුස් වහන්සේ සමඟ සම්බන්ධතාවය තුළ නැති නම් ජාතිය වෙනස් කර ගැනීමට යාච්ඤා කළ යුතු ප්‍රමාණය ඔබ අවබෝධ කරගන්නේ නැත. යාච්ඤා කිරීමට ආරම්භ කරන විට යේසුස් වහන්සේඔබ තුළ සිටින අතර, උන්වහන්සේ ලෝකයේ බර උසුලාගෙන සිටින බව දකින්න.

**"උන්වහන්සේ මදක් ඉස්සරහට ගොස් මුහුණින් වැටී, අහෝ, මාගේ පියාණෙනි, මේ කුසලාන මා කෙරෙන් පහවෙන්නට පුළුවන් නම් එසේ වේවා. එසේ වී නමුත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවායි කියා යාච්ඤා කළ සේක."** (මතෙව් 26:39) බොහෝ මනුෂ්‍යයන් ප්‍රශංසා කිරීමට ආශා කරන නමුත් ඔවුන් තමුන්ගේ මුහුණින් වැටී යාච්ඤා කිරීමට ආශා කරන්නේ නැත. යම් අවස්ථාවන් පැමිණෙන විට ඔබගේ සියලු ප්‍රශංසාවන් නතර කර සමහර කාරණා ගැන යාච්ඤා කිරීමට ආරම්භ කිරීම වැදගත් වන්නේය. විශේෂයෙන් දෙවියන් වහන්සේගේ සෙනඟ එක්රැස්වන විට එසේ කළ යුතුය. යාච්ඤා කිරීම හෝ පසුතැවිලිවීම වෙනුවට ප්‍රශංසා කිරීම ආදේශ කළ නොහැකිය. දෙවියන් වහන්සේගේ සෙනඟ පසුතැවිලිවීම මහත් වූ එක් අවශ්‍යතාවයකි.

දෙවියන් වහන්සේගේ සෙනඟ පසුතැවිලි නොවන්නේ නම් එහි පිබිදීමක් හටගන්නේ නැත. ඒ අතරම දෙවියන් වහන්සේගේ සෙනඟ පසුතැවිලිවීම තුළ පැවතීමට ඉගෙන ගෙන නැත. බයිබලය තුළ නැති වූ අය වෙනුවෙන් නොව 85% ත් 90% ත් අතර ප්‍රමාණයක් දෙවියන් වහන්සේගේ සෙනඟගේ පසුතැවිලිවීම වෙනුවෙන් උපදෙස් ලබාදී තිබෙන සේක. එහෙම වුනත් දෙවියන් වහන්සේගේ සෙනඟ ඉදිරිදාවක් පාසා ඉරිදාවක් දේවස්ථානයට පැමිණෙන්නෝය. නමුත් දෙවියන් වහන්සේ ඔවුන්ට පසුතැවිලිවීමට නියෝග කරන බව ඔවුන් අවබෝධ කරගන්නේ නැත. දෙවියන් වහන්සේගේ පූර්ණත්වය අත්දැකීමට පෙර පසුතැවිලිවීම අත්‍යවශ්‍යවේ. යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ සෙනඟට ලබා දුන්නා වූ පණිවිඩය කුමක්ද ? ..... **"එතැන් පටන් යේසුස් වහන්සේ, පසුතැවිලි වෙයල්ලා, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරන්ට පටන්ගත් සේක."** (මතෙව් 4:17) දෙවියන් වහන්සේගේ මුළු පූර්ණත්වය, බලය සහ අභිමුඛත්වය පිළිගැනීමට උන්වහන්සේ දෙස බලා සිටීම අවශ්‍යය වන්නේය. නමුත් ඔබගේ පසුතැවිලිවී බලා සිටීම මත ඒවා ලැබෙන්නේය.

පසුතැවිලිවීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඔබ වැරදි මාර්ගයක ගමන් කරමින් සිටි අතර ඔබ ආපසු හැරී දෙවියන් වහන්සේගේ මාර්ගය තුළට ගමන් කිරීමයි. නමස්කාර දේවමෙහෙයකදී අප අතරේ බොහෝ දෙනාට නිවැරදි මාර්ගයේ ගමන් කරනවා යැයි හැගෙන්නේය. දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ බොහෝ දෙනා නමස්කාර කරමින් සිටියත් දේව වචනයට අනුව ඔවුන් වැරදි මාර්ගයේ ගමන් කරනු ලබන්නෝ වෙති. නමුත් ඔවුන් තමුන්ගේ අවශ්‍යතාවය කුමක්දැයි ඒත්තු ගන්නේ නැත. එ නිසා ඔවුන් විනාශයට ගොදුරු වෙති. ඊශ්‍රායෙල් සෙනඟ, යුදා සෙනඟ, යෙරුසලම සහ දේව මාළිගාවත් විනාශ වූයේය. පවුරු ඇද වැටුණෝය. එමෙන්ම දෙවියන් වහන්සේගේ සෙනඟ අවුරුදු හැත්තෑවකට වහල්කමට හසුවිය. මක්නිසාද ඔවුන් පව්කර තිබෙන බවත්, ඔවුන් පසුතැවිලි විය යුතු බවත්, ඔවුන් අවබෝධ කරගත්තේ නැත. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේගේ මුඛයෙන් උන්වහන්සේගේ සෙනඟ වෙතට පැමිණි ප්‍රථම වචනය වූයේ දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ සම්පූර්ණ අභිමුඛත්වය, බලය

4 පිටුවට

3 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේ සමඟ යාච්ඤාවේ...

පතුරුවා හැරීම මත රැඳී සිටීමට **"පසුතැවිලිවෙයල්ලා"** යනුය. ඔබට සහ මට උන්වහන්සේ දී තිබෙන්නා වූ පණිවිඩයන් එයම බව ඔබට පැවසීමට මට පුළුවන්ද.. ? දෙවියන් වහන්සේගේ ක්‍රියාව, බලය සහ උන්වහන්සේගේ අභිමුඛත්වයේ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම අත්දැක නොමැති නම් ඊට හේතුව අපි උන්වහන්සේ තුළ පසුතැවිලිවීමේ අත්දැකීම ලබා නොමැති නිසාය.

## ගෝලයන් නිදිබරව සිටියේය.

**"උන්වහන්සේ මදක් ඉස්සරහට ගොස් මුහුණින් වැටී, අහෝ මාගේ පියාණෙනි, මේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට පුළුවන් නම් එසේ වේවා. එසේ වී නමුත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවායි කියා යාච්ඤා කළ සේක. උන්වහන්සේ ගෝලයන් ළඟට ඇවිත් ඔවුන් නිදා ඉන්නවා දැක, පේත්‍රුස්ට කථා කොට කිමෙක්ද .. ?**

**මා සමඟ එක පැයක්වත් අවදිව ඉන්ට නුඹලාට බැරිවුණාද .. ? නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව ඉඳ යාච්ඤා කරපල්ලා. ආත්මය නම් කමැතිය, නමුත් මාංශය බෙලහීනයයි කී සේක. උන්වහන්සේ නැවත දෙවෙනි වරත් අහක්ව ගොස් අහෝ, මාගේ පියාණෙනි, මේක මා විසින් නොබී පහවෙන්ට බැරි නම් ඔබගේ කැමැත්ත වේවායි කියා යාච්ඤා කළ සේක. උන්වහන්සේ නැවත ඇවිත් ඔවුන් නිදා ඉන්නවා දුටු සේක. මක්නිසාද ඔවුන්ගේ ඇස් නිදිබරව තිබුණේය. නැවතත් උන්වහන්සේ ඔවුන් අතහැර ගොස්, තුන්වෙනි වරත් ආයෙත් එම වචන කියා යාච්ඤා කළ සේක. එකල උන්වහන්සේ ගෝලයන් ළඟට ඇවිත් ඉතින් නිදාගෙන නිවාඩු ගනිල්ලා. මෙන්න පැය ළඟය, මනුෂ්‍ය පුත්‍රයා පව්කාරයන්ගේ අත්වලට පාවා දෙනු ලබයි. නැගිටපල්ලා, අපි යමු. අන්න, මා පාවාදෙන්න ළඟයයි කී සේක."** (මතෙව් 26:39-46)

කුරුසයේ මරණයට පත්වීමේ දෙවියන් වහන්සේගේ සදාකාල අරමුණ පිළිබඳව ස්ථිර තීරණයක් ගැනීමට යන අවස්ථාවේ දී එම පාරිශුද්ධ අවස්ථාවට යේසුස් වහන්සේ සමඟ සහභාගිවීමට යාම සඳහා උන්වහන්සේ පේත්‍රුස්, යොහාන්, යාකොබ් යන තිදෙනාම ආරාධනා කළ සේක. ඒ ආකාරයෙන්ම යේසුස් වහන්සේ අන් වෙසක්වීමේදී උන්වහන්සේ සමඟ කඳු මුදුනට යාමට ඔවුන් තිදෙනාව තෝරාගත් සේක. එහිදී යේසුස් වහන්සේ මෝසෙස් සහ එළියාව මුණ ගැසුණු අතර ඔවුන් උන්වහන්සේ යෙරුසලමේදී කරන්නට යන පූජාව ගැන කථා කරමින් සිටියෝය.

**"එවිට මනුෂ්‍යයෝ දෙදෙනෙක් උන්වහන්සේ සමඟ කථා කළෝය. ඔවුහු නම් මෝසෙස් සහ එළියාය. ඔවුහු තේජසින් යුක්තව පෙනී, උන්වහන්සේ යෙරුසලමේ දී සිදුකරන්ට තිබුණු උන්වහන්සේගේ ඉකුත්වීම ගැන කථා කරමින් සිටියෝය."** (ලූක් 9:30-31) යෙරුසලමේ දී සිදුවෙන්නා වූ උන්වහන්සේගේ මරණය කරුණුකොට ගෙන මුළු ලෝකයම උන්වහන්සේ නිදහස් කරන්නට යන බවත්, යේසුස් වහන්සේ තුළින් සම්පූර්ණ කරන්නා වූ දෙවියන් වහන්සේගේ මිදීම ගැනත් මෝසෙස් සහ එළිසා සමඟ කථා කරමින් සිටි සේක. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් තිදෙනාටත් උන්වහන්සේ සමඟ ගොස් ඒ පැයේ ප්‍රබලතාවය සහ යම් දෙයක් ගැන යාච්ඤා කිරීමේ වැදගත්කම අත්දැකීමට ආරාධනා කළ සේක. දෙවියන් වහන්සේගේ දරුවන් යාච්ඤා කරන විට ස්වර්ගය සහ පොළොව එකට ගමන් කිරීමට යොමු වන්නේය. ඉතිහාසය මේ මොහොත සමඟ එකට ගමන් කරනු ලබන්නේය.

## දෙවියන් වහන්සේ සැස්කටූන් නගරය බැහැදුටු සේක

සැස්කටූන් නගරයේ සිටීමට දෙවියන් වහන්සේ මට අවස්ථාවක් ලබා දුන් සේක. අවුරුදු දෙකකට පෙර මේ නගරයේ දෙවියන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය රඳා පැවතුණේය. මම මුණගැසුණා වූ පාලකවරුන් සහ අනිත් අය සමඟ එක්ව යාච්ඤා කළෙමි. අපි යාච්ඤා කරන විට දෙවියන් වහන්සේ මගේ හදවත ස්පර්ශ කරනවා මට හැඟුණේය. මගේ හදවතේ තිබුණා වූ පාප උන්වහන්සේ හඟවා දුන් සේක. සතියක් පාසා සතියක් යාච්ඤා කිරීමේ කාලය තුළ උන්වහන්සේ මාව පවිත්‍ර කර උන්වහන්සේ වෙතට ඇදගනිමින් පාපයෙන් මාව නිදහස් කරගනු ලැබූ සේක. එය සැබවින්ම සහ ඉතා වැදගත්ව තිබූ නිසා මම දේවස්ථානයට නැවත නැවත දුවගොස් සෙනඟ අතරේ එය බෙදා ගනිමින් පාලකවරයාගේ සේවය ඉටු කළෙමි. සභාවේ සෙනඟ පවිත්‍රවීමටත්, නැවත ගොඩ නැගීමටත් පටන්ගත්තෝය. එමෙන්ම ඔවුන් සියලුදෙනාම දෙවියන් වහන්සේගේ හදවතේ පවතින්නා වූ හැඟීමට ඇහුම්කන්දීමට පටන්ගත්තෝය.

ඊළඟට, ඒ අවස්ථාවේ දී බිල් මැක්ලියොඩ් මට කථාකොට "හෙන්රි අපි යාච්ඤා කරද්දී යම් කාරණා සිදුවෙමින් පවතින්නේ යැයි කිවේය. " ඔහුගේ සභාවේ උපස්ථාදායකයන් දෙදෙනෙක් වසර දෙකක් තිස්සේ එකිනෙකා සමඟ කථා කර තිබුණේ නැත. අනර්ඝ වූ එක් රාත්‍රියකදී ඔවුන්ගෙන් එක්කෙනෙක් තමන්ගේ වරද ගැන මහත් අවබෝධයකට පැමිණ, තමාගේ ක්‍රියාවන් හරිගස්වා ගනිමින් සභාවේ ඉදිරියට පැමිණ හිස නමාගෙන යාච්ඤා කරමින් දෙවියන් වහන්සේව මුණගැසුණේය. ටික වේලාවකින් දේවස්ථාන ශාලාවේ අනිත් පසින් අනිත් සහෝදරයා ද පැමිණ ඒ ආකාරයෙන්ම ඔහුගේ පාපය ගැනත් සමාව අයැදිමින් යාච්ඤා කරන්නට විය. ඔවුන් දෙදෙනාම තමන් මුළු සභාව ඉදිරියේ සිටින බවත් සභාවේ සිටි බොහෝ දෙනාත් ඔවුන් දෙදෙනා සිටි තත්ත්වය දැන සිටියෝය. එදින රාත්‍රියේ මුළු සභාව ඉදිරියේ ඔවුන් දෙදෙනා එකිනෙකාව වැළඳගෙන අඬමින් පසුතැවිලි වෙමින් ඔවුන්ගේ සම්බන්ධාතව නැවත ගොඩනගා ගත්තෝය.

එය සිදුවෙනවාත් සමඟම ඊළඟට සිදුවූ දේත් "බිල් " මට පැවසුවේය. ක්ෂණිකවම තරුණ වයසට පැමිණෙමින් සිටි ගැහැණු දරුවෙක් දේවස්ථාන ශාලාවේ ඉදිරියට ඇවිත් සිටගත්තාය. අනිත් පැත්තෙන් ඇගේ මව ඉදිරියට පැමිණ සිටගනු ලැබීය. මව හඬමින් ඇගේ දුවට මෙසේ කීවාය." මට සමාවෙන්න, මම ඔයාට හොඳ අම්මා කෙනෙක් වුනේ නැහැ...." ඇගේ දුවද, "මමත් ඔයාට හොඳ දුවෙක් වුණේ නැහැ." කියා පිළිතුරු දුන්නාය. ඔවුන් දෙදෙනා එකිනෙකාගේ බෙල්ල බදාගෙන දෙවස්ථානය හරහා දුවගෙන ගියෝය. දේව මෙහෙය අවසන්වෙලත් පැය ගණනාවක් තිස්සේ දෙවියන් වහන්සේ එකිනෙකාව ස්පර්ශ කරමින් සිටි සේක.

දෙවියන් වහන්සේ සැස්කටූන් නගරය ස්පර්ශ කළ සේක. සති 7½ ක් තිස්සේ දෙවියන් වහ්සේගේ ආත්මය ඇදහිය නොහැකි තරම් බලයෙන් යුක්තව මුළු නගරය පුරාම ක්‍රියා කරනු ලැබූ සේක. සභාවත් ක්ෂණිකවම පසුතැවිලි වෙමින් දෙවියන් වහන්සේ වෙතට හැරී ආවෝය. වසර ගණනාවක් දෙවියන් වහන්සේ ස්පර්ශ කරනු ලැබූ සෙනඟගේ ජීවිතවල උන්වහන්සේගේ බලය සහ අභිමුඛත්වය රැඳී තිබුණේය. මම දහදෙනෙකුගෙන් යුක්ත වූ සභාවක සේවය කරමින් සිටි අතර මම සැස්කටූන් නගරයට යන විට ඔවුන් සිත්තැවුලට පත්ව සිටි නමුත් දැන් ඔවුන්ට මාව ඒ සඳහා නිදහස් කිරීමට අවශ්‍යය විය. දෙවියන් වහන්සේගේ බලය සහ අභිමුඛත්ව පැමිණ මනුෂ්‍යන්ගේ ජීවිත ස්පර්ශ කිරීම නිසා අළුතින් සභාවන් තිස් අටක් ආරම්භ කිරීමට හැකි වූවාය. ඔවුන්ගේ ඉතිහාසය තුළ වෙන කවදාවත් නොවූ ලෙස ඔවුන් එක් සභාවකින් තවත් ජන සමාජයක් තුළ සභාවන් ආරම්භ කරනු ලැබූවාය. අපි මෙහෙකරුවන් ලෙස යාච්ඤා කිරීම ආරම්භ කළෙමු. මෙතෙක් කල් ඔවුන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙතට සුභාරංචිය ගෙනයාමට සමීපවී සිටියේ නැත. නමුත් දැන් මම විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් එකසිය අසූවක් බෞතිස්ම කරනු ලැබූවෙමි. ඔවුන් මෙතෙක් සෙනඟව සේවයට කැඳවා තිබුණේ නැත. නමුත් දැන් සියයකට වඩා වැඩි පිරිසක් සේවයට කැඳවනු ලැබූවෝය. සේවයට කැඳවනු ලැබූවාවූ අයව පුහුණු කිරීම සඳහා අපි බයිබල් විද්‍යාලයක් ආරම්භ කරනු ලැබූවෙමු. හාරසිය අසූවකට වඩා වැඩි පිරිසක් බයිබල් විද්‍යාලයේ පුහුණුව සඳහා පැමිණියෝය. ඔවුන්ගේ ජීවත කැනඩාව සහ ලොව වඩා මනුෂ්‍යයන්ගේ ජීවිතවලට බලපෑමක් ඇති කරනු ලැබුවෝය. විශාල ලෙස මනුෂ්‍යයන්ව ස්පර්ශ කරනු ලැබුවාවූ මේ මධ්‍යයේ මගේ පුත්‍රයන් හතර දෙනාවත් දෙවියන් වහන්සේ සේවයට කැඳවනු ලැබූ සේක.

## පිබිදීමට කලින් අසාමාන්‍ය ලෙස යාච්ඤා කිරීම පැවතිය යුතුයි

මෙම අවස්ථාවේ දී දෙවියන් වහන්සේගේ පූර්ණත්වය තුළ පිලියෙල කරන සේක. යේසුස් වහන්සේ ගෙත්සෙමන උයනේසිටින විට උන්වහන්සේගේ ගෝලයන් එම අද්විතීය අවස්ථාව මගහැර ගන්නවාට යේසුස් වහන්සේ කැමැති නොවූ සේක. ඔබ ඉතිහාසයේ කාරණා කියවන විට දෙවියන් වහන්සේගේ බලවත් වූ ක්‍රියාවන් සහ මහත් වූ පිබිදීමක් ඇති වී තිබෙන්නේ සැමවිටම පිබිදීමට කලින් අද්විතීය පරිමාණයෙන් යාච්ඤා කිරීම සමඟ එකට ගමන් කිරීම තුලින් බව ඔබ දකිනවා ඇත. දෙවියන් වහන්සේගේ සෙනඟ ඔවුන් දැන සිටියා වූ ඕනෑම දෙයකටත් වඩා එහායින් ඔවුන්ගේ හදවත්වල යම් දේවල් කිරීමට දෙවියන් වහන්සේ ඔවුන්ව කැඳවන සේක. යේසුස් වහන්සේගේ ගෝලයන් තුලින් දෙවියන් වහන්සේගේ සෙනඟ වශයෙන් මුළු රෝම අධිරාජ්‍යය ස්පර්ශ කිරීමට සහ වෙනස් කිරීමට පියාණන් වහන්සේට අවශ්‍යව තිබෙන බව යේසුස් වහන්සේ දැන සිටි සේක. එම නිසා දෙවියන් වහන්සේගේ වෙලාව පැමිණි විට ඔවුන් යාච්ඤා කරනවා දකින පිණිස උන්වහන්සේ ඔවුන්ගේ හදවත් සූදානම් කර තැබූ සේක.

දෙවියන් වහන්සේගේ හදවතේ ඇති බර උන්වහන්සේට අයිති අයගේ හදවත්වල තබන සේක. ගෙත්සෙමන උයනේ දී පියාණන් වහන්සේගේ පැය තීරණය කළා වූ දෙයක් නොව දෙවියන් වහන්සේ සියවස් ගණනාවකට කලින් ඒ මොහොත සැලසුම්කර තිබූ සේක. ඒ අවස්ථාව වන විට ලෝකයම නැවත උන්වහන්සේට සමගි කර ගැනීමට සැලසුම්කර තිබූ සේක. පියාණන් වහන්සේගේ හදවතේ තිබූ අභිප්‍රාය පුත්‍රයාණන් වහන්සේ අවබෝධ කරගෙන උන්වහන්සේගේ යාච්ඤා කිරීමේ කාලය තුළ සැබෑ තත්ත්වය එළිදරව් කළ සේක. ඒ ආකාරයෙන් යාච්ඤා කිරීම අද්විතීය වූ යාච්ඤා කිරීම් වන්නේය. යේසුස් වහන්සේ මේ ගෝලයන් තිදෙනාට මෙලෙස ප්‍රකාශ කළ සේක. **"එකල යේසුස් වහන්සේ ඔවුන්ට කථාකොට, මැරෙන තරම් මගේ ආත්මය ඉතා ශෝක සහිතය. නුඹලා මෙහි නැවතී මා සමඟ අවදිව සිටපල්ලා යයි කී සේක."** (මතෙව් 26:38) යේසුස් වහන්සේ දැඩි වේදනාවෙන් සිටි බව ඔවුන් දුටුවෝය. (ලූක් 22:44) උන්වහන්සේගේ දහඩිය මහත් ලේ බින්දු මෙන් වැටුණු බව සඳහන්ව තිබේ.

ඇමරිකාවට (ඔබගේ දේශයට) පිබිදීම පැමිණ නැත්තේ ඇයි කියා ඔබ දන්නවාද ... ? අපි පිබිදීම ලබාගැනීම උදෙසා යාච්ඤා කරන්නේ නැත. පාපය රජකිරීමට ඉඩහැර අපි තෘප්තිමත් වන අතර ඊළඟට පාපයේ අප්‍රසන්නකම කොපමණදැයි දෙවියන්

5 පිටුවට

**"ජීවතුන්ගේ දේශයෙහි ස්වාමීන්ගේ යහපත්කම දකින්නට ලැබේයයි නොඇදහුවෙම් නම් කොපමණ අසරණද .... ?" (ගීතාවලිය 27:13)**

4 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේ සමග යාච්ඤාවේ ...

වහන්සේට මැසිවිලි නගන්නෙමු. දෙවියන් වහන්සේ කියන්නා වූ ඕනෑම අවස්ථාවකදී ඔබ වටා සිටින අය වෙතට හැරී මිලය ගෙවීමට ඔබට පුළුවන්ද .. ? නමුත් එය සාමාන්‍ය යාච්ඤා කිරීමක් නොවේ. යාච්ඤා කිරීමේ තවත් ඉදිරි පියවරකට ඔබව ගෙනයාමට දෙවියන් වහන්සේට ඉඩ හැරීමට ඔබ කැමතිද ? දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් සමග ඔබ ඒකත්වය ඇතිව ඒ පැයේ දී ඔබ ඉදිරියට යමින්, උන්වහන්සේගේ සෑම වචනයකටම ඇහුම්කන්දෙමින්, සෑම ක්‍රියාකාරකම් ගැන අවධානයෙන් බලා සිටිනවාද .. ? යේසුස් වහන්සේ ගෝලයන්ගෙන් ඇසුවාක් මෙන් අපෙන් ද අසන සේක. නුඹලාට එක පැයක්වත් මා සමග අවදිව සිටින්න බැරිද .. ?

## පැහැදිලිව සසදා වෙනස බලාගන්න.

ගීතාවලිය 78:9-11 දක්වා පදවල දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ එක් ගෝත්‍රයක සෙනඟ ගැන කණගාටුදායක ලෙස සඳහන්ව තිබෙන දේ බලන්න. එක් අවස්ථාවකදී ඔවුන් දෙවියන් වහන්සේ තෝරාගනු ලැබූ සෙනඟ විය. දෙවියන් වහන්සේගේ සෙනඟ ඔවුන්ගේ සතුරන්ට විරුද්ධව භයංකර සටනකට මුහුණදීමට යන බව දෙවියන් වහන්සේ දැන සිටි සේක. දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ කොටසක් ලෙස උන්වහන්සේ ඒප්‍රායිම් සෙනඟව කැඳවනු ලැබූ සේක. ඔවුන්ට සටනට අවශ්‍යය යුද්ධායුධ ලබා දී තිබුණු සේක. නමුත් අසන්නට අපහසු ඛේදවාචකයක් විය. මක්නිසාද කාරණා තුනක් නිසා මෙම ඛේදවාචකය සිදු වී තිබුණි.

**"යුද්ධයට සැරසී දුනුගත් ඒප්‍රායිම් පුත්‍රයෝ සටන් දවසේ දී පස්සට හැරුණෝය."** (ගීතාවලිය 78:9) මෙහිදී ඔවුන් තමන්ගේ සටන අතහැර දැමීමට හේතු වූ කාරණා තුනක් තිබුණේය. **"ඔවුහු දෙවියන් වහන්සේගේ ගිවිසුම රක්ෂා නොකළෝය. උන්වහන්සේගේ ව්‍යවස්ථාව ලෙස හැසිරෙන්නට නොකැමතිවූවෝය. උන්වහන්සේ කළ දේද උන්වහන්සේ තමුන්ට දැක් වූ ආශ්චර්යය ක්‍රියා ද ඔවුහු මතක නැති කළෝය."** (ගීතාවලිය 78:10-11)

දෙවියන් වහන්සේ යුද්ධයට සන්නද්ධවීම සම්පූර්ණයෙන්ම ලබාදී තිබූ සේක. නමුත් ඔවුන් දෙවියන් වහන්සේගේ කාර්‍ය්‍ය සඳහා සපයා දී තිබූ දේ ප්‍රතික්ෂේප කළෝය. ඔවුන් යුද්ධයට සැරසී සිටියත්, දුන්න දරාගෙන සිටියත්, සටනට අවශ්‍ය සියළු දේ තිබුණත් යුද්ධය පැමිණිවිට ඔවුන්ගේ හදවත් සන්නද්ධ වී තිබුණේ නැත. ඔවුන්ගේ හදවත් එයින් හැරී ගොස් තිබුණේය. හිස් බව තුළ ඔවුන් ජීවත් විය. නියම අරමුණෙන් ඈත්ව සිටීමටත් ඔවුන් යොමු වී සිටියෝය. දෙවියන් වහන්සේගේ අනිත් සෙනඟ මීට වඩා වෙනස් වූ ස්වභාවයක සිටියෝය.

ඒප්‍රායිම් ගෝත්‍රයේ අය දෙවියන් වහන්සේගේ ගිවිසුම රක්ෂා කළේ නැත. දෙවියන් වහන්සේ ඔවුන්ව තෝරාගත් බවත්, කැඳවූ බවත්, දෙවියන් වහන්සේගේ වෙලාවට උන්වහන්සේගේ සෙනඟට අවශ්‍යව තිබෙන සියලුම දේ සපයා දෙන බවත් ඔවුන් අමතක කළෝය. ඔවුන් පොරඹදන අවස්ථාවේදී දෙවියන් වහන්සේ ඔවුන්ට අවශ්‍ය දේ සපයාදීමට ක්‍රියාකරන සේක්ද ? එසේය, උන්වහන්සේ ඔවුන් උදෙසා ක්‍රියා කරන සේක. උන්වහන්සේගේ සැපයීම සෑහෙන ලෙස ක්‍රියාකරන සේක්ද .. ? එසේය, උන්වහන්සේ ඔවුන්ට උවමනා ප්‍රමාණයෙන් සපයා දෙන සේක. නමුත් ඔවුන් දෙවියන් වහන්සේගේ කැඳවීම මත රැඳී සිටීමට, උන්වහන්සේ ඔවුන්ට ලබාදී තිබෙන ආශිර්වාදය මත රැඳී සිටීමට ක්‍රියා නොකළේය.

ඔවුන් උන්වහන්සේගේ ව්‍යවස්ථාව තුළ ජීවත්වීම ප්‍රතික්ෂේප කළෝය. දෙවියන් වහන්සේ ඔවුන් උදෙසා සැලසුම් කර තිබුණු මාර්ගයෙන් ඔවුන් ඈත්ව ගියෝය. දෙවියන් වහන්සේ ඔවුන් උදෙසා ලබා දී තිබෙන්නේ මොනවාදැයි ඔවුන් අවබෝධ කරගත්තා නම් ඔවුන් ඒවා තුළ ගමන් කරනවා ඇත. ඔවුන්ට තිබෙන්නා වූ සටන ද අවබෝධ කරගන්නවා ඇත. නමුත් ඔවුන් දෙවියන් වහන්සේ දී තිබුණා වූ ශුද්ධ ලියවිලි කියෙව්වේ නැත. එම නිසා දෙවියන් වහන්සේ අපේක්ෂා කරන දේ සම්පූර්ණයෙන්ම නොදැන සිටියෝය.

මම නිතරම පාලකවරුන්ගේ රැස්වීම්වලදී, "ඔබ මහත් වූ නියොග්‍ය තුළ පවතිනවාද..?" (මතෙව් 28:18-20) කියා අසන්නෙමි. ඔවුන් සියලුදෙනාම ඔවුන්ගේ අත් ඔසවනු ලබන්නෝය. එවිට මම දෙවෙනි ප්‍රශ්නය අසන්නෙමි. "ඔබ මහත් වූ නියෝගය විශ්වාස කිරීම ( ඉටු කිරීම) තුළ පවතින්නේ නම්, ඔබ අතරෙන් කී දෙනෙක් යේසුස් වහන්සේ ආඥා කළ සියලු දේ ක්‍රමානුකූලව සකස් කරගෙන දෙවියන් වහන්සේගේ සෙනඟට උගන්වා ක්‍රිස්තුස් වහන්සේ ආඥා කර තිබෙන සියලු දේ ක්‍රියාවට දමන්නේ කෙසේද .. ?" පාලකවරුන් අතරේ අවුරුදු විස්සක් තිස්සේ මම එම ප්‍රශ්නය අසන්නෙමි. එහෙත් එලෙස කරන්නා වූ එක පාලකවරයෙක්වත් මට සොයා ගැනීමට නොහැකි විය.

ඔබ කියන්නේ කුමක් වුවත් එය සැලකිල්ලට නොගෙන, ඔබ මහත් වූ නියෝගය විශ්වාසයෙන් ඉටුකිරීම තුළ නොපවතින බව මගේ ඊළඟ ප්‍රකාශනයයි. ඔබ මහත් වූ නියෝගය වෙනස් කරගෙන ඇත. ගෝලයන්ව බිහිකර ඔවුන්ව භෞතිස්ම කරනු ලබන්නෝය. එය මහත් වූ නියෝගයේ එක් කොටසකි. මහත් වූ නියෝගයේ ඊළඟ කොටසට පැමිණෙන්න. **"මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මම ද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටීමයි කී සේක."** (මතෙව් 28:20) ක්‍රියා දෙවනි පරිච්ඡේදයේ ඇති ඇදිහිලිවන්තයන් තුළ ඔබ දකින්නේ කුමක්ද ? **"තවද ඔවුහු ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහිද, රොටි කැඩීමෙහි ද, යාච්ඤාවල ද, ස්ථිර ලෙස පැවතුණාහ."** (ක්‍රියා 2:42) පළමු සභාවේ අලුත් ඇදිහිලිවන්තයන්ට රෝම අධිරාජ්‍යය උඩ යට මාරුකිරීමට හැකිවූයේ කෙසේදැයි ඔබ දන්නවාද ? ඔවුන් දවස්පතා නොකඩවා ක්‍රිස්තුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට පවත්වන්ට ආඥාකළා වූ සියලුම දේ අපසෝතුළුවරු උගන්වද්දී අසා සිටියෝය.

බොහෝ ඇදිහිලිවන්තයන් සතියකට වරක් ඉරිදා උදෑසන දේව මෙහෙයට සහභාගිවන්නේය. ඔවුන් යේසුස් වහන්සේ ගෝලයන්ට පවත්වන්ට ඉගැන්වූ දේවල් ප්‍රමාණවත් ලෙස අසන්නේ නැත. එසේ නම් ඔවුන් ඒවා පවත්වන්නේ කෙසේද .. ? සමහර යාච්ඤා රැස්වීම්වලට සහභාගි වෙති. නමුත් වැඩිමහල්ලන්, උපස්ථායකයන් යාච්ඤා රැස්වීම්වලට සහභාගි නොවන බව මම දැක ඇත්තෙමි. එම නිසා මහත් වූ නියෝගය ඉටු කිරීමට සභාවට නොහැකි වී ඇත. ඔබ දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ පවතින යාච්ඤා රැස්වීම්වලට සහභාගි නොවී සිටින විට දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ නායකයෙක් වන්නේ කෙසේද ..? දෙවියන් වහන්සේගේ සෙනඟ හා එක්ව උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ මැදිහත්කාරකම් කරන්නේ කෙසේද .. ? අපි පසුතැවිලි විය යුතුය. අපි වැරදි මාර්ගයක ගමන් කරමින් සිටින්නෙමු.

ඇදහිලිවන්තයෙනි, ශුද්ධාත්මත්යාණන් වහන්සේ කරුණුකොටගෙන අපව සන්නද්ධ කර තිබෙන සේක. ජීවමාන ක්‍රිස්තුස් වහන්සේගේ අභිමුඛත්වය අපට ලබා දී තිබෙන සේක. අපගේ ජීවිත තුළ දෙවියන් වහන්සේගේ පූර්ණත්වය තබා තිබෙන සේක. ශුද්ධ ලියවිල්ල කරුණුකොටගෙන අපව සන්නද්ධ කර තිබෙන සේක. දෙවියන් වහන්සේ ඉදිරියට පැමිණ යාච්ඤා කරමින් අපගේ අවශ්‍යතාවයන් ඉල්ලා සිටීමට අවස්ථාව ලබා දී තිබෙන සේක. වෙනත් වුවමනාවන් ද සපයා දී තිබෙන සේක. අපට උපකාර කිරීමට අප වටා දෙවියන් වහන්සේගේ සෙනඟව තබා තිබෙන සේක. එසේ වුවත් යුද්ධයට සැරසී සිටියා වූ දුනුගත්තා වූ අපි මේ දවස්වල දී සටනෙන් ආපස්සට හැරීගොස් ඇත. වෙනත් කාරණාවල යෙදීමෙන් මේ සටන ජය ගැනීමට හැකියාවක් නොමැත. සටන තුළ සිටින්නා වූ අපගේ සහෝදරයන්ව අපි අතහැර සහ ඔවුන්ට තනිවම සටන් කිරීමට අපි ඉඩ හැර ඇත්තෙමු.

## ප්‍රායෝගික ක්‍රියා මාර්ගවලට සම්බන්ධ කරගන්න

ඉතා ප්‍රයෝගික උපදේශයක් ඔබට ලබාදීමට මට ඉඩදෙන්න. ඔබ නමස්කාර දේව මෙහෙයට සහභාගි වන අතර තුර දෙවියන් වහන්සේ ඔබට සටනේ යෙදීමට ආරාධනා කරන්නා වූ එක් ක්‍රියා මාර්ගයකි. නමස්කාර මෙහෙය ආරම්භ කරන විට අපි සෑම විටම යාච්ඤා කාලයක් ගත කරන්නෙමු. ඔබගේ හදවතේ යම් බරක් තිබෙනවා නම් ඔබට පසුතැවිලි වී හරිගස්වා ගැනීමට කාරණා ඇත්නම් දෙවියන් වහන්සේ ඉදිරියට පැමිණ හරිගස්වාගෙන උන්වහන්සේව මුණ ගැසෙන්නැයි අපගේ පාලකතුමා පවසන්නේය. එවිට බොහෝදෙනා එයට එකඟව ක්‍රියා කරනු ලබනවා අපි දකින්නෙමු.

එක් ඉරිදා උදෑසනක දේව මෙහෙයට පෙර වයස අවුරුදු විසි ගණන්වල සිටි තරුණයෙක් දේශනා කුඩුව ඉදිරියේ දණින් වැටී දැඩි වේදනාවකින් සිටිනවා මම දුටුවෙමි. මක්නිසාද ඔහුගේ දෑත් වේදනාවෙන් බරවී, ඔහු වේදනාවේ බර මහත් ලෙස දරාගෙන සිටියේය. දෙවියන් වහන්සේ මට කථාකොට "හෙන්රි ..., ඔබ ඔහු සමඟ එක්ව සටන් කරන්නට යන්නේ නැද්දැයි ඇසූ සේක." එය මගේ කාර්යය නොවේයැයි කියා ඉවතට හැරී යාමට අපට නුපුළුවන. ඒ නිසා මම ඔහු සමීපයට පැමිණ දණින් වැටී ඔහු සමඟ සටනට සම්බන්ධ වූයෙමි. මම යාච්ඤා කිරීම සුදුසු යැයි මම සිතූ විට මට මගේ මුවින් වචන තුනක්වත් පිට කිරීමට හැකි නොවීය. මේ තරුණයා ඔහුගේ දෑත් වලින් මාව බදාගෙන "ඩොක්ටර් බ්ලැකබේ .. මේ ඔබ දැයි ඇසීය. "

"ඔබ දරාගෙන සිටින බර (වේදනාව) කුමක්දැයි පවසන්නැයි මම ඔහුට කීවෙමි." "මේ සතියේ මම විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳව උපාධිය ලබනවා. නමුත් දෙවියන් වහන්සේ මාව සේවයට කැඳවනවා. මම මෙහි දෙවියන් වහන්සේ ඉදිරියේ සිට උන්වහන්සේට අයාචනා කරමින් දෙවියන් වහන්ස.., මම කළ යුතු කුමක්දැයි දැන ගැනීමට මට උපකාර කිරීමට මා ළඟට කාව හරි එව්ව මැනවයි කීවෙමි. දෙවියන් යන්සේ ඔබව එවූ සේකැයි කීවේය. "

එය ආත්මික සටනක්ද .. ? ඔව් එය ආත්මික සටනකි. එහි අභිප්‍රාය කුමක්ද ? බොහෝ දෙනා උදෙසා එය සදාකාලිකව නියම කළා වූ කාරණයකි. මාවත් ඔහු සමඟ මේ සටනට යොමු කිරීමට දෙවියන් වහන්සේට වුවමනා වූ සේක්ද ... ? නැවත හැරී යන පිණිස දහස් ගණන් නිදහසට කාරණා මට හදාගෙන මට මේ මනුෂ්‍යයාගේ ජීවිතයේ කාරණා සමඟ සම්බන්ධ විය නොහැකියි කියා පැවසීමට පුළුවන්ද ... ? මම ඔහුව දන්නේ නැහැ, නමුත් ඔහු අපගේ සභා පවුලේ කෙනෙකි. මමත් ඒ පවුලේ සාමාජිකයෙකි. මම යුද්ධයට සැරසී දුණු ගෙන සිටියෙමි. ඒ මොහොතේ තිබූ සටන මම මගහැර නොගියෙමි.

තවත් ඉරිදා දවසක මම දේවස්ථානයේ කුළුණු පෙළ අතරින් යද්දී මුහුකුරා ගිය වැඩිහිටි කාන්තාවක් කම්මුල් දිගේ ඇගේ කඳුළු ගලාගෙන යන තරම් අඬමින් සිටිනවා මම දුටුවෙමි. මම එය දුටු විට තවත් එක් පියවරක්වත් ඉදිරියට යාමටවත් වෙන කිසිවක් කරන්නටවත් මගේ හදවතේ ඉඩ නුදුන් සේක. මම මගේ අත ඇගේ උරහිස මත තැබූවෙමි. ඇය තමාගේ මුහුණේ කඳුළු සමගම මා වෙතට හැරුණාය. "අද ඔබ මහත් බරකින් අඬමින් සිටිනවා මම දැක්කා" කියා මම කීවෙමි.

6 පිටුවට

**"තේජස අපේ දේශයෙහි වසන පිණිස සැබවින්ම උන්වහන්සේගේ ගැලවීම උන්වහන්සේට භයවෙන්නන් සමීපයෙහිය." (ගීතාවලිය 85:9)**

5 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේ සමඟ යාච්ඤාවේ ..

ඇය දුක්මුසු මුහණින් මා දෙස බලා , "මගේ ස්වාම්පුරුෂයා මරණයට පත්වෙලා අදට අවුරුද්දයි මට එය අමතක කළ නොහැකියි කියා ඇය කීවාය." "ඔබව බැඳ දමා තිබෙනවා, එය ඔබට හැගෙනවාද .. ?" කියා මම ඇගෙන් ඇසූවෙමි. "ඔව්, මේ කාරණයෙන් මේ මුළු අවුරුද්දපුරාම මාව විලංගු දමා බැඳ තිබෙනවා වගේ මට හැගෙනවා. එහෙත් එයින් නිදහස් වෙන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ."

මම මුළුමනින්ම සන්නද්ධ වී සිටියෙමි. "මම ඔබට යාච්ඤා කරනවාට ඔබ කැමතිදැයි මම ඇසූවෙමි." ඔබ යාච්ඤා කරන්නේ කෙසේදැයි ඔබ දන්නේ නැතිනම් රෝම 8:26 වන පදය කියවන්න. **"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වල දී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්නට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක."** (රෝම 8:26)

ක්ෂණිකවම මගේ හදවතට පැමිණි දෙය මම මෙසේ කීවෙමි. "ස්වාමීන් වහන්ස .... , යාච්ඤා කරන්නේ කෙසේදැයි මම නොදනිමි. ඔබවහන්සේ මට උපකාර කළ මැනව". මම යාච්ඤා කරන්නට පටන් ගත්තේමි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ උපකාරය ඇතිව යාච්ඤා කිරීමට ආරම්භ කළෙමි. ඔබ යාච්ඤා තළ යුතු කෙසේදැයි උන්වහන්සේ ඔබට පෙන්වා දෙන සේක. ඇගේ හදවතේ සහ ජීවිතයේ යම් දෙයක් සිදු වූ බව ඇගේ මුහුණෙන් පෙනුණේය. මම යාච්ඤා කර අවසන වූ විට ඇය මා දෙසා බලා "මම නිදහස් වුනා...! මම නිදහස් වුනා ....! කියා පැවසුවාය. දෙවියන් වහන්සේ ඇයව නිදහස් කළ සේක.

වැන්දඹු අයට නත්තල ඉතා අපහසු බව මම දනිමි. ඒ නිසා නත්තල් පැමිණි විට "ඔබගේ කටයුතු කොහොමදැයි මම ඇගෙන් අසූවෙමි." ඇය මා දෙස බලා , "මම නිදහස්ව සිටිනවා. මගේ ස්වාමිපුරුෂයාව මගේ මතකයේ තියෙනවා. නමුත් මම ඔහු නැති වේදනාවෙන් විලංගුවලට හසු වී නැහැ. මම දෙවියන් වහන්සේගේ නිදහස ඇතිව සිටිනවා" යනු ඇගේ වචන වූවාය. ඒ නත්තල ඇයට මහිමාන්විත නත්තලක්ව තිබුණාය.

## තවත් බොහෝ නිදර්ශන (වැඩිදුරටත් පැහැදිලි කිරීම්)

නැගෙනහිර ටෙක්සාස් ප්‍රාන්තයේ සභාව තුළ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ ක්‍රියාව හඳුනාගන්නේ කෙසේද කියා ඇවිත් ඔවුන්ට උගන්වන්නැයි මගෙන් ඉල්ලා සිටියෝය. එම නිසා එක් ඉරිදා උදෑසනක මම එහි දේශනා කරමින් සිටියෙමි. එමෙන්ම මම සෑමවිටම දෙවියන් වහ්නසේගේ බලවත් ක්‍රියා කිරීමත් මට එයට සම්බන්ධවීමට හැකිවන්නේ කෙසේද කියාත් දැකීමට ආරාධනා කරන්නෙමි. වයස අවුරුදු දහයක පමණ කුඩා ගැහැණු ළමයෙක් පිටුපස සිට ඉදිරියට ඇවිත් දණින් වැටී යාච්ඤා කරනවා මගේ අවධානයට යොමු විය. වෙන කිසිවෙකු ඇය සමඟ සම්බන්ධ වූයේ නැත. මම විශ්මයට පත්ව සිටින නිසා වේදිකාවෙන් පහළට බැස ඇවිත් මේ කුඩා ගැහැණු ළමයාගේ ළගින් දණගසා ගතිමි. ඇය ගැලවීම ලබා නැති ඇගේ මිතුරන් වෙනුවෙන් යාච්ඤා කරන බව මට පැහැදිලි විය. මම ඇය දෙසට හැරී "මේ අනර්ඝ උදෑසන වෙලාවේ ඔබ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ සිටින බව ඔබ දැනගත යුතු යැයි ඇයට කීවෙමි." දෙවියන් වහන්සේ ඔබෙ මොරගැසීමට ඇහුම්කන්දී තිබෙන නිසා ඔයා ගිහින් ගැලවීමට පැමිණ සිටින මිතුරන්ව ගණන් කරන්නැයි ඇයට කීවෙමි. මට එලෙස කියන්නට හැකි වූ බයිබලයේ එලෙස පවසා තිබෙන නිසාය.

ඉරිදා රාත්‍රියේ මම දේශනා කරන විට නැවත මම කලින් ලෙසම ආරාධනා කළෙමි. උදෑසන පැමිණි කුඩා ගැහැණු දරුවාම ඉදිරියට පැමිණි අතර ඇය සමඟ තවත් කුඩා ගැහැණු දරුවෙකු ඉදිරියට පැමිණියාය. ඒ කලින් යාච්ඤා කළ දරුවාගේ මිතුරියක් බව මට අවබෝධ විය.

ඔබගේ සභාවේ දේශනා කූඩුව ඉදිරියේ දී සටන් කිරීමට දෙවියන් වහන්සේව සම්බන්ධ කර ගැනීමට ඔබට පුළුවන්ද .. ? දෙවියන් වහන්සේගේ දරුවන් අතරේ කෙනෙක් ලෙස උන්වහන්සේ ඔබට ලබා දී තිබෙන අවස්ථාව බේදජනක නොවන පිණිස ආත්මික සටනට ඇතුල්වී, මනුෂ්‍යයන්ව බැඳීම්වලින් මුදා ගනිමු. නමුත් ඔබ ආපසු හැරී එය මගේ කාර්යයක් නොවේ යැයි පවසන්නේද .. ? ඔබ අතර සමහර වැඩිහිටියන්ට මම කෙලින්ම කථා කරන්ට කැමැත්තෙමි. යම් කෙනෙක් යාච්ඤා කිරීමට පූජාසනය ඉදිරියට යනවා ඔබ දකින්නේ නම්, ඔබට ඔවුන් සමඟ සම්බන්ධ නොවී සිටීමට පුළුවන්ද.. ? එහිදී ආත්මික සටන පවතින්නේය. වෙනත් කෙනෙක් යැයි කියා පවස්නේ නැතිව ඔබ ඒ සඳහා ඉදිරියට යන්න. විවිධ වූ ඕනෑම සටනකට උන්වහන්සේ තුළ ඔබට සම්බන්ධවීමට අවශ්‍යය. සන්නද්ධවීමෙ හැකියාව උන්වහන්සේ ලබා දී තිබෙන සේක. මම යම් කෙනෙක් සමඟ යාච්ඤා කරන විට සමහර විට දොඩනවා මෙන් පෙනෙන්නේය. නමුත් අස්වභාවික ලෙස ජයග්‍රහණයත්, සතුරා පලා දුවනවාත්, එකිනෙකාගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේ තුළ ස්වාමී වූ දෙවියන් වහන්සේ වෙතට පැමිණෙනවාත් මම සොයා ගතිමි.

ඒ ඔබගේම දරුවන්ගෙන් කෙනෙක් විය හැකිය. එක් ඉරිදාවක විශ්ව විද්‍යාලයෙන් මට ආරාධනාවක් ලැබී තිබුණ බැවින් මම මගේ දෙවෙනි පුතා සමඟ එහි ගියෙමි. මාගේ දෙවෙනි පුතාගේ මුහුණ වේදනාවෙන් තිබුණේය. ඔහු ඉකිගසමින් අඩමින් සිටියේය. සාමාන්‍යයෙන් ඔහු තමාව පාලනය කර ගැනීමට හොඳ හැකියාවක් තිබුණු අයෙකි. නමුත් එම ඉරිදා ඔහු වේදනාවෙන් පිරී සිටියේය. මම පහළට ගොස් ඔහු සමඟ කථා කළෙමි. "තාත්තේ.., තවත් තුන් හතර දෙනෙක් මෙහි පැමිණෙන්නට තිබුණා. ඔයාට ඔවුන් ගැනත් අවධානය දෙන්න තිබුණා යැයි කීවේය." "පුතා.., අද නොවෙයි කියා මම කීවෙමි." "තාත්තේ.., ඔයා මාව විතරක් අරගනෙ ආවා අද මට ඔයත් එක්ක කාලය ගතකරන්න ඕනේ. මම දන්නේ නැහැ හැමදේම සිදුවෙන්නෙ කොහොමද කියලා. නමුත් මම හිතනවා ඔයා කරන දේවලට මටත් දායක වෙන්න පුළුවන් කියලා." මම මගේ අත ඔහුගේ කරවටා දැමීමි. අපි නැවත කාර්යාලයට ගියෙමු. ඔහු ඔහුගේ සිතේ තිබූ දේ ප්‍රකාශ කළේය. ඒ මොහොතේ ඔහු තමාගේ ජීවිතයේ දෙවියන් වහන්සේගේ කැඳවීම සමඟ පොර බදිමින් සිටියේය.

මම ඉතා සතුටු වූයෙමි. මෙය මගේ සටන නොවේ යැයි කීමටවත්, යම් අය මෙන් එය මගහැර යාමටවත් මට නොහැකි විය. මම සතුටින් සිටිද්දී දෙවියන් වහන්සේ මෙසේ පැවසූ සේක. "හෙන්රි..., ඔබට මේ සටන අවලංගු කරන්නට බැහැ. ඔබ ඔබේ පුතා වෙනුවෙන් යාච්ඤා කර තිබෙනවා. ඔබ ඔහු දෙස බලා සිටියා. දැන් ඔහුගේ ජීවිතයේ සටන තුළ ඔහු සිටිනවා ඔබ ඔහුට සම්බන්ධ වී ජයග්‍රහණය ලබා ගැනීම සදහා ඔහුට උපකාර කළ යුතුය." මගේ කාර්යාලයෙන් ඔහු පිටව යද්දී දේවියන් වහන්සේගේ කැඳවීම පිළිබදව තීරණයකට එකඟතාවයකට පැමිණ සිටියේය. අවුරුදු දෙකකට නෝර්වේ රටට පිටත්ව ගිය ඔහු නැවත පැමිණි අතර ඊළඟට ප්‍රධාන පාලකවරයෙක් ලෙස ඔහු නැවත නෝර්වේ රටට පිටත්ව ගියේය. මගේ දරුවන් පස්දෙනාටම දෙවියන් වහන්සේ කැඳවා තිබෙන බව හැගුණු විට මම සන්නද්ධව සිට ඔවුන් සමඟ සටනට උරදුන්නෙමි. සටන ජය ලැබූ බව මම දුටුවෙමි.

ඔබ යේසුස් වහන්සේ සමඟ අවදිව සිට යාච්ඤා කරනවාද ... ?

දෙවියන් වහන්සේ ඔබගේ ජීවිතය තුළ ක්‍රියාකිරීම උදෙසා ඔබ තීරණාත්මකව පිළියෙල (සූදානම්) විය යුතුය. යේසුස් වහන්සේ සමඟ ගෙත්සෙමන උයනට යාමට උන්වහන්සේගේ ආරාධනවා ඔබට අවශ්‍යව තිබේ. ඔබ යේසුස් වහන්සේ සමඟ ගෙත්සෙමන උයනේ ඉදිරියට ගියා වූ තිදෙනාගෙන් කෙනෙක් ලෙස මා සමඟ අවදිව සිටීමට මා සමඟ යමු යැයි උන්වහන්සේ ඉල්ලා සිටිනවා ඔබට ඇසෙනවාද .. ? ඔබගේ දවස්වල මේ ජාතියේ බර මම උසුලා සිටින අතරතුර ඔබ මා සමඟ අවදිව සිට යාච්ඤා කරනවාද .. ? උන්වහන්සේ සමඟ ගමන් කිරීම කැමති අය දෙස යේසුස් වහන්සේ බලා සිටින සේක. ඔබ අතරෙන් යම් කෙනෙක්ට මේ තීරණාත්මක මොහොත් මම ඔබ ඉදිරියේ දණින් වැටී සිටිමියි කියා පැවසීමට පුළුවන්ද .. ? ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ සමඟ යමි. මගේ පැයේ මේ සටන මම අත්නොහරිමි. මම අවදිව සිට ජයග්‍රහණය ගෙන එන්නෙමි. ඒ සඳහා මට ඔබ සමඟ සිටීමට අවශ්‍යව තිබේ. මගේ යාච්ඤා ජීවිතය තුළ රැඳී සිටීමට වඩා වෙනත් දෙයක් මට අවශ්‍යය නොවේ. මම මගේ ස්වාමීන් වහන්සේ සමඟ වඩා ගැඹුරු තත්ත්වයකින් යාච්ඤා කරන්නෙමි. මම සිටින්නා වූ ස්ථානයෙන් ඉදිරියට යාමට මට අවශ්‍යව තිබේ. ඔබටත් එලෙස අවශ්‍යය වන්නේද .. ?

# ක්‍රිස්තුස් වහන්සේගේ නාමයේ සුවඳ...

ඔක්ටේවියස් වින්ස්ලෝ විසිනි

**"නුඹේ විලවුන් මිහිරි සුවඳින් යුක්තය. නුඹේ නාමය වැගිරෙවු විලවුන් මෙන්ය. එබැවින් කන්‍යාවෝ නුඹට ප්‍රේම කෙරෙති."** (සාල මොන්ගේ ගීතිකාව 1:3)

යේසුස් වහන්සේගේ නාමය සභාවට අනර්ඝව තිබේ. එය උන්වහන්සේගේ සියළු ශුද්ධවන්තයන්ගේ අත්දැකීමයි. එහි සුවඳ ආලේපයක් ලෙස වැගිරීම ඉදිරියේ ඔවුන්ගේ ප්‍රේමයේ උණුසුම සහ ඔවුන්ගේ ප්‍රශංසාවේ අභිමානය ප්‍රබෝධමත්වේ. සියලු දේ වෙනුවෙන් අපි යේසුස් වහන්සේගේ නාමයේ සෙනෙහසට අපගේ හදවත් සම්බන්ධ කර තබා ගැනීම අවශ්‍ය වේ. උන්වහන්සේ අපගේ අනාගතවකතෘ වශයෙන් පියාණන් වහන්සේගේ කැමැත්ත අපට උගන්වන සේක. උන්වහන්සේ අපේ පූජකයා වශයෙන් අපව පාපයෙන් මුදා ගන්නා පිණිස උන්වහන්සේගේම ජීවිතය පූජා කරමින් කුරුසියේ මැරුණු සේක. උන්වහන්සේ අපගේ රජතුමා වශයෙන් උන්වහන්සේගේ සිංහාසනය සහ උන්වහන්සේගේ යටහත්කමේ (කීකරුකමේ) සහ සෙනෙහෙවන්තකමේ කාරණා අපගේ හදවත්වල ගොඩනගන සේක. එසේම උන්වහන්සේගේ නාමය තුළ අපව මිතුරන් වශයෙන් සෑම අවස්ථාවකදීම අපට සෙනෙහස දක්වන සේක. උන්වහන්සේ අපගේ සහෝදරයා වශයෙන් අපේ ඇට වලින් ඇට සහ මාංශයෙන් මාංශයව සිටින සේක. අපගේ විපත්තියේ දී අප තුළම සිටින සේක. මේ දේවලිනුත් උන්වහන්සේගේ සුවඳ අප තුළ විහිදුවන සේක. අපගේ මහත් වූ උත්තම පූජකයා වශයෙන් සදාකාලයටම පවතිමින් අපගේ හැගීම් ස්පර්ශ කරන සේක. අපගේ වේදනාවලදී, දුක්විඳීම්වලදී අපගේ සෝදිසි

7 පිටුවට

6 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේගේ නාමයේ සුවඳ...

කිරීම්වලදී අපව වටකරගෙන සියලුම කාරණාවලදී මෘදු මොළොක් ලෙස අපව උන්වහන්සේගේ සළුවෙන් වසාගෙන උන්වහන්සේ වෙතට ඇදගනු ලබන සේක.

නමුත් යේසුස් වහන්සේගේ නාමයේ ආලේපය සැබවින්ම අප ඉදිරියේ වැගිරෙනවාද.. ? පරණ ගිවිසුමේ ශුද්ධවන්තයන්ට ක්‍රිස්තුස් වහන්සේගේ දවස සහ සතුට විවෘතව පැවතුණේ අඩක් පමණි. වසර හාරදහසකට ප්‍රථම ඒදන් උයනේ දී ආරම්භ වූ පාපයේ දූෂිත වාතාවරණය මත කුරුසියේ දී කළා වූ යේසුස් වහන්සේගේ මහත් වූ පූජාවේ සුවඳ විහිදුවා හරිනු ලැබූ සේක. ගැලවීමේ පළමුවන පොරොන්දුව තුළ මනුෂ්‍යායට ආලේපය වගුරුවනු ලැබූ සේක. මෙහිදී ගැලවුම් කරුවාණන්ගේ මිහිරි සුවඳත්. ව්‍යවස්ථාව යටතේ සිදුවුනා වූ පූජාවීමේ ගැඹුරු ස්වභාවයේ වැදගත්කමත්, මෝසෙස්ගේ සංකේතාත්මක ආගමික වතාවනුත් දන්වා සිටින සේක. ක්‍රිස්තුස් වහන්සේගේ මිහිරියාව (ප්‍රසන්න බව) සහ සියලුම වස්තුවේ අභිප්‍රාය අර්ථවත් කරනසේක. ඒ අතරම අසම්පූර්ණකම පැතිරී යන්නේ කෙසේද .. ?

කල්වාරියේ වැදගත් සිදුවීම තුළ මෙම අනර්ඝ වූ ආලේපය සම්පූර්ණයෙන්ම පිටතට ගලායාම සඳහා වෙන්කර තැබූ සේක. යේසුස් වහන්සේගේ කුරුසියේ පූජාවීම තුළ තිබූ වේදනාව සහ ගෙත්සෙමනේ උයනේ දී උන්වහන්සේගේ දහඩිය ලේ බවට පත්වීම වෙතට අපි නැවත හැරෙමු. අනුකම්පා විරහිත ලෙස උන්වහන්සේගේ දෑත් දෙපා ඇණ ගසා සිදුරු කරන විට. අනිත් පැත්තෙන් සොල්දාදුවන්ගේ නිග්‍රහ කිරීම් උන්වහන්සේව පසාරු කරගෙන යන විට කටු ඔටුන්නෙන් උන්වහන්සේගේ හිස සිදුරු වන විට, පියාණන් වහන්සේ මෙම වේදනාව දරා ගැනීමට උන්වහන්සේට ඉඩ හැර තිබෙන විට උන්වහන්සේ දැඩි වේදනාවට පත් වූ සේක. ඊළඟට දේව මාළිගාවේ තිරය දෙකඩවීමත්, අනර්ඝ වූ ආලේපය වැගිරීම ඉදිරියේ එහි සුවඳවිහිදීයාමත්, පොළොවේ ඉතා දුරස්ථර ස්ථානවලට පහසුවෙන්ම වහනයවීමත් ස්වර්ගීය දේව මාළිගාව සුවඳින් පිරීයාමත් සිදු විය.

කල්වාරියේ සිට නැගුණා වූ අනර්ඝ වූ සුවඳ සහ යේසුස් වහන්සේව ස්වර්ගයට ඔසවා ගැනීමේ දී දේව දූතයන් ඉදිරියේ මහිමයට පත්වීම කොපමණ අනර්ධද .. ? මහිමයේ සිංහාසනය වටේට එම මිහිරි සුවඳ පැතිරී ගියේය. පූජාවේ සුවඳ විහිදීමෙන් ජෙහෝවා දෙවියන් වහන්සේ ඉතා සතුටු වූ සේක. එය උන්වහන්සේගේ සියලු ස්වභාවයන්ට අනුකූල වූ සේක. උන්වහන්සේගේ නාමය මහිමයට පැමිණීම තුලින් උන්වහන්සේගේ සභාවට සම්පූර්ණ ගැලවීම හිමි වේ.

දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණන්ව දේශනා කූඩුවේ දී ඔසවන විට ආලේපය වැගිරී සුවඳ විහිදුවමින් ස්වාමී වූ යේසුස් වහන්සේගේ ප්‍රේමය, දයාව, මහිමය ගලායන සේක. යම් ස්ථානයක ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසපත්වීම සරලව සහ සම්පූර්ණයෙන් දේශනා කරනවාද එම ස්ථානයේ සුවඳ විහිදීයාමෙන් ශුද්ධ භූමියක් බවට පත්වේ. ශුද්ධකමේ වතාවරණය සහ එම පූජණීය ස්ථානයේ මෙහෙය බොහෝ අනර්ඝව පවතින්නේය. එහි අනුගමනය කරන පිළිවෙත් ක්‍රමය සරලව සහ චාම් විය හැකිය. සංවිධානය නොමේරූ (පරිනත නොවූ) තත්ත්වයක තිබිය හැකිය. මනුෂ්‍ය දක්ෂතා ස්වල්පයක් පමණක් තිබිය හැකිය. එසේ වුවත් ක්‍රිස්තුස් වහන්සේ දේශනා කළේ ආලේපයේ සුවඳ විහිදුවා හරින්න. ශුද්ධ වූ ගෘහය එයින් පිරීයනු ඇත කියා වන සේක.

කිසිවක් නැති පව්කරුවන් උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ සේවය ආරම්භ කිරීම කොපමණ ආශිර්වාදලත් සහ මහත් වූ වරප්‍රසාදයක්ව තිබෙනවාද .. ? ආත්මයාණන් වහන්සේගේ ආලේපයත් ඒ සමඟම ගමන් කරන සේක. අපි උන්වහන්සේගේ නාමයේ සුවඳ සමඟ සම්පූර්ණයෙන්ම පැවතීමෙන් එය වැළඳගන්නේය. එය සිදුවන්නේ කොහේද .. ? කවුරු කරුණුකොටගෙනද කියා නොඇසිය යුතුය. එහිදී මෙය ප්‍රමාණවත්ව තිබේ. **"ඉතින් කිමෙක්ද .. ? වංචාවෙන් වේවා සැබෑකමෙන් වේවා ඒ කොහොම වෙතත් සියලු ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කරනු ලබන සේක. ඊට ප්‍රීතිවෙමි. එසේය. තවත් ප්‍රීති වන්නෙමි."** (පිලිප්පි 1:18)

ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජන මේසයේදී මෙම ආලේපය වගුරවනු ලබන සේක. යේසුස් වහ්සේගේ ගෝලයන් උන්වහන්සේගේ නාමයේ රැස්වන විට, යේසුස් වහන්සේ මරණයට පත්වීමට තරම් තිබුණා වූ ප්‍රේමය මතකයේ තබාගෙන සහ එය ප්‍රකාශ කරමු. සතුටෙන් ඉපිලී යන්නා වූ ශුද්ධ වූ අවස්ථාව මෙයයි. අනිත් සියලුම නාමයන් මතකයෙන් මැකී යන්නේය. අපගේ සියලු සිතුවිලි, සෙනෙහස සහ ආශාවන් යේසුස් වහන්සේගේ නාමය මත ඒකරාශී කරගනිමු. අපගේ මිදුම්කාර වූ ස්වාමීන් වහන්සේගේ නාමය සියලු නාමවලට වඩා උසස්ව තිබේ. මෙම ශුද්ධ වූ භෝජනයට සමීපවීමට යේසුස් වහන්සේව මුණගැසීමට පමණක් ආශා විය යුතුය. ඉතා වැදගත් වූ මෙම කාරණා වලින් යේසුස් වහන්සේගේ ප්‍රේමණීය මරණය දෙස බැලීම සංඛේතවත් කරන්නේය. ඇදහිල්ලෙන් උන්වහන්සේ වෙතට ළඟාවීමෙන් උන්වහන්සේව මුණ ගැසීම අපේක්ෂා කිරීමට සහ යේසුස් වහන්සේගේ ආශිර්වාදය කෙලින්ම ලබා ගැනීමට යොමු වෙමු.

ඔබේ නාමය තුළ මෙම ආශිර්වාද ලබා ගැනීමට නුපුළුවන් බව මතකතබාගන්න. සැමරිය යුතු වන්නේ ඔබගේ නාමය නොවන බවත් ඔබ නියෝජනය කරන්නේ යේසුස් වහන්සේගේ නාමය, ප්‍රේමය, වටිනාකම බව මතකතබාගන්න. සැකයෙන් පැකිලෙන්නේ නැතිව රාත්‍රී භෝජනයේ ඔබගේ ස්ථානයේ සිටින්න. ඔබගේ පාපය අතහැර දමන්න. ඔබගේ වේදනාවන්, සෝදිසි කිරීම්, අවශ්‍යතාවයන් යන සියලු දේවලදී මෙම ආලේපයේ සුවඳ විහිදුවන්න. වළාකුලකින් මෙන් එම ආලේපයෙන් ඔබව ආවරණය කරන සේක.

මෙම ආලේපය කිතුණුවන් සමඟ සම්බන්ධතාවය සහ ස්වාමීන් වහන්සේගේ සෙනගගේ සහභාගිකම තුළ වගුරුවනු ලබන සේක. **"එකල ස්වාමීන් වහන්සේ කෙරෙහි භය ඇත්තෝ එකිනෙකා සමඟ කථාකර ගත්තෝය. ස්වාමීන් වහන්සේ ද කන්දී ඇසූ සේක එවිට ස්වාමීන් වහන්සේ කෙරෙහි භය ඇත්තා වූ උන්වහන්සේගේ නාමය සැලකුවා වූ අය ගැන උන්වහන්සේ ඉදිරියෙහි සිහිවීමේ පොතක් ලියන ලද්දේය."** (මලාකි 3:16) මෙය දේවදරුවන්ගේ (ශ්‍රද්ධාවන්තයන්ගේ) සහභාගීත්වයේ සැබෑ අදහසයි. යේසුස් වහන්සේ ගැන නිතරම එකිනෙකා සමඟ කථාකරගත්තෝය. කිතුණුවන් අතර සහභාගීත්වය ප්‍රසන්න වූ වරප්‍රසාදයකි. පොළොව මත ශුද්ධවන්තයන් යෙදී සිටින්නා වූ ස්වර්ගීය උපකාරය සහිත කාරණයකි. ආලේපය ගලා යන්නේ කෙසේද ? සුවඳ විහිදී යන්නේ කෙසේද .. ? ආත්මය ප්‍රබෝධමත් කරගන්නේ කෙසේද ..? හදවත් ගිණි ඇවිලෙන්නේ කෙසේද ..? මේ සියළුදේම සිදුවන්නේ කිතුණුවන් එක්ව සිට යේසුස් වහන්සේ ගැන කථාකරද්දී වන්නේය.

යේසුස් වහන්සේ ඔවුන් වෙතට පැමිණ ඔවුන් සමඟ සහභාගිකම් පවත්වන සේක. **"මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන් ඔවුන් මැද සිටිමියි කී සේක."** (මතෙව් 18:20) යේසුස් වහන්සේ කොතැනද ස්වර්ගය එතැන තිබෙන සේක. ඔබගේම පුද්ගලික කාරණා මත රැඳී නොසිට ශුද්ධවන්තයන්ගේ සහභාගිකම උසස් කිරීමට එකට බැඳී සිටීම ඉලක්ක කරගන්න. සියලු කාරණාවලදී මෙම ආලේපයේ සුවඳ මත රැඳී සිටීම ඕනෑකමින් වැළඳගන්න. ජීවයක් නැති ඔබගේ දැඩි ආගමික විශ්වාසයන් නිසා ශුද්ධවන්තයන්ගේ සහභාගීත්වය ශීතලවීමට ඉඩ නොහරින්න. නමුත් ඔබගේ කිතුණු ජීවිතයේ ක්‍රියාකාරකම් වලින් බලපෑමක් ඇති කිරීම අවශ්‍යව තිබේ. කිතුණුවන්ගේ සහභාගීත්වයට අපෝස්තුළු පාවුල් ආශා කලේ කෙසේදැයි බලන්න. **"මක්නිසාද නුඹලා ස්ථිරවන හැටියට නුඹලාට යම් කිසි ආත්මික දීමනාවක් දෙන පිණිස නුඹලා දකින්ට ආශාවෙමි. මෙසේ කියන්නේ නුඹළාගෙත්, මගෙත්, අන්‍යෝන්‍ය ඇදහිල්ල කරුණුකොටගෙන නුඹලා සමඟ මටත් සැනසිල්ල ලැබෙන පිණිසය."** (රෝම 1:11-12) එම නිසා යේසුස් වහන්සේ ගැන අනිත් අය සමඟ කථා කිරීමට ඉඩ සලස්වාගන්න.

සෑම ස්ථානයකදීම ක්‍රිස්තුස් වහන්සේගේ මිහිරියාව රසවිඳීමට උත්සහගන්න. උන්වහන්සේව ලැජ්ජාවට පත්නොකරන්න. සුවද තෛලය අඩංගු කරඬුව විවෘත කරන්න. ආලේපය වැගිරවීම අවශ්‍යව තිබේ. ලෝකය ඉදිරියේ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිපත්ති ප්‍රකාශ කළ යුතුය. එහිදී යේසුස් වහන්සේගේ නාමයේ බලය ප්‍රතික්ෂේප නොකර, බියගුළුකමින් උන්වහන්සේගේ නාමයේ බලය සඟවානොගෙන, උන්වහන්සේගේ නාමයේ පැතිරීම නොවලක්වා උද්යෝගිමත්ව බලපෑමකින් යුතු වූ පෙළඹවීමක් ඇති කළ යුතුය. ආලේපය අපගේ දකුණතේ තිබෙන බව අනාවරණය විය යුතුය. ලෝකයේ මනුෂ්‍යයන් සහ දේව දරුවන් (ශුද්ධවන්තයන්) යන දෙගොල්ලන්ම අපි යේසුස් වහන්සේ සමඟ සිටින බව දැනගත යුතුය. සෑම පැයකදීම (මොහොතකදීම) අප තුළ ආලේපය රඳවා ගැනීමෙන්, සෑම මෙහෙයකදීම ආලේපය ක්‍රියාවේ යෙදවීමෙන් සියලු සම්බන්ධතාවයන් පෝෂණය කර ආලේපයේ සුවඳ විහිදුවා හැරිය යුතුය. ජීවිතය තුළ නොකඩවා ශුද්ධ වූ සුවඳ විහිදවිය යුතුය. නමුත් මෙය අවාසනයේ දී ආලේපලත් තැනැන්වහන්සේ වන යේසුස් වහන්සේ සමඟ අපි වඩා වඩා පැවතිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේගෙන් හටගන්නා වූ ආශිර්වාදලත් ආත්මික ඇඳුම් අපට පළඳවන සේක. දිව්‍යමය ආත්මික ඵල අප තුළ වැඩිකරන සේක. ශුද්ධ වූ සුවඳ අපගේ පුද්ගලික ජීවිතවලින් අප වටා සිටින සියල්ලන් වෙත විහිදුවා හරින සේක.

අපගේ සම්බන්ධතාවය ක්‍රිස්තුස් වහන්සේ සමඟ පවතින බව අපි අවබෝධ කරගත යුතුයි. අප ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගමන් කළ යුතුයි. ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපි වාසය කළ යුතුය. අපගේ හදවත් තුළ ඇති ආලේපය සිත්වලට කාවදින ලෙස සෑම මාවතකම විහිදුවා හැරිය යුතුය. අපගේ මුළු පැවැත්ම තුළ එම ආලේපය උතුරා යා යුතුය. සියලු වේදනාවන් යේසුස් වහන්සේ සමඟ මිශ්‍රකර උන්වහන්සේගේ මුළු ප්‍රීතිය සමඟ දැවෙමින් සියළුම මෙහෙයන්වලට උන්වහන්සේව සම්බන්ධ කරගෙන කටයුතු කළ යුතුය. ඒ අනුව අප තුලින් දෙවියන් වහන්සේ මෙලෙස ක්‍රියා කරන සේක. **"ඔබගේ වස්ත්‍ර සියල්ලෙන් ගන්ධරස අගිල් සහ කුරුඳු සුවඳ නික්මෙයි. ඇත්දත්මය මාළිගා තුලින් වීණාවෝ ඔබට ප්‍රීති ඉපදෙවූවෝය".** (ගීතාවලිය 45:8) අපගේ කාර්යයන්වල නිරතවීමට, දුක්දරා ගැනීමට, නොකඩවා වෙහෙසවී වැඩ කිරීමට, උන්වහන්සේගේ නාමයේ බලපෑමත් සමඟ සුවඳ විහිදුවමින් සදාචාර සම්පන්න වාතාවරණයක් තුළ මිහිරි සුවඳක්වීමට හැකියාව ලබාදෙන සේක.

වේදනාත්මක අවස්ථාවන් තුළ දී මෘදු මොළොක් ගතිගුණ ඇතිව අරුම පුදුම ලෙස සැනසීමට ආලේපය හිමිව පවතින්නේය. යේසුස් වහන්සේගේ නාමය හැර මිත්‍රයෙක්ව සහ සහෝදරයෙක්ව සිටන වෙනත් නාමයක් නොමැත. **"මිත්‍රයෙක් සෑම කල්හිම ප්‍රේමවන්නේය. සහෝදරයෙක් ඉපද සිටින්නෙත් විපත්තියේ දී පිහිටවීමටය."** (හිතෝපදේශ 17:17) විපත්ති අවස්ථාවලදී අන්සියළුම දේට වඩා උන්වහන්සේගේ නාමය

8 පිටුවට

Reg. No: QD/NEWS/15/2022
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



7 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේගේ නාමයේ සුවඳ...

කෙරෙහි ඉතා අනර්ඝ ලෙස විශ්වාසය තැබිය හැකිය. ඒ තුළ අදහිලිවන්තයන්ගේ ජීවිතවල සියළු වාතාවරණයන්වලදී යේසුස් වහන්සේ අයිතිය හිමිකරගන්නවා පෙනෙන්නේය. උන්වහන්සේ තුළ පියාණන් වහන්සේව සතුටු කරමින්, යේසුස් වහන්සේ උන්වහන්සේගේ සභාව උදෙසා මැදහත්කරුවාණන් ලෙස උන්වහන්සේගේ පරිපූර්ණත්වය තුළ වාසය කිරීමට සැලකිලිමත් වෙමු. විශේෂයෙන් සියලු වේදනාවල දී යේසුස් වහන්සේව අපට සැහෙන්නේය. **"බලව යෙරුසලමෙහි සිමියොන් නම් මනුෂ්‍යයෙක් සිටියේය. මේ මනුෂ්‍යයා ඊශ්‍රායල්ගේ සැනසීම බලාසිටියාවූ ධර්මිෂ්ඨ වූ, භක්තිවන්ත කෙනෙක්ය. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහු කෙරෙහි වූ සේක."** (ලූක් 2:25) විපත්ති කාලය තුළ බිහි වී ශාරොන් හී පුෂ්පය මෙන් සහ දෙවියන් වහන්සේ කරුණුකොට ගෙනත්, මනුෂ්‍යයා සහ සාතන් කරුණුකොටගෙනත් පොඩි කරනු ලැබූසේක. යේසුස් වහන්සේ මේ සියල්ලේ දී තමන් වහන්සේව හික්මවා ගැනීම කරුණුකොටගෙන ජයග්‍රහණයට සුදුසු වූ සේක්ද ... ? උන්වහන්සේගේ දුක්විඳීමේ වස්ත්‍රය පැළගැනීම සඳහා බැඳී සිටීමට සභාව එකඟ විය යුතුය.

ක්‍රිස්තුස් වහන්සේගේ අනුකම්පාවේ සුවඳ ඊළඟට ඒත්තු ගත යුතුය. වර්තමානයේ ඔබ මුහුණ දෙන ඉතා ගැඹුරු කාරණාවලදී ක්‍රිස්තුස් වහන්සේ මෙන් විශ්වයේ පවතින වෙන කිසිවෙක් ඔබට සමීපවන්නේවත්, ප්‍රේම කරන්නේවත්, අනුකම්පාව දක්වන්නේවත් නැත. උන්වහන්සේ ඔබ සමඟ කටයුතු කරන නිසා දුෂ්කරතාවයන් සැලකිල්ලට නොගන්න. ඔබගේ හදවත වෙනත් දෙයකට ප්‍රේම කිරීමට උන්වහන්සේගෙන් නොබෙදී සම්පූර්ණයෙන්ම උන්වහන්සේ තුළ පැවතීම අවබෝධ කරගන්න. දැන් ඔබ උන්වහන්සේට ගෞරව කරමින්, උන්වහන්සේගේ ආශිර්වාදය ලබාගන්නේ ද .. ? ඔබ අත්හදා බලා වැඩියෙන් ක්‍රිස්තුස් වහන්සේව දැනගනු ලබන්නෝය. ඔබ උන්වහන්සේගේ ඉතා උසස් වූ මහිමය දැන් වඩා වැඩියෙන් දකින්නාහුය. ගැඹුර මැන බැලිය නොහැකි උන්වහන්සේගේ ප්‍රේමය වඩා වැඩියෙන් පානය කරන්න. ඔබගේ පසුගිය සියලු අත්දැකීම් තුළ උන්වහන්සේගේ මෘදු මොළොක් දයානුකම්පාව සම්පූර්ණයෙන් අත්දකින්න.

විපත්තියේ කාරණා අත්දකින්නා වූ පාසල තුළ දී පමණක් අප සැබෑ ලෙස යේසුස් වහන්සේව හඳුනාගන්නෙමු. උන්වහන්සේව තේරුම්ගෙන සෝදිසි කිරීම්වලදී උන්වහන්සේ සමඟ ඒකත්වයක් ඇතිව සිටින්නේ කෙසේද .. ? සෝදිසි කිරීම් වලින් ගමන් කරන තෙක් අපි උන්වහන්සේගේ හදවතේ ඇති වේදනාව දරා සිටින්නේ ස්වල්ප වශයෙනි. දැඩි ශෝකය අපව දෙවියන් වහන්සේ වෙතට සමීප කිරීමට ඔසවනු ලබයි. ඔබගේ දැනීම වර්ධනය කර ගැනීම සමඟ ඔබගේ සමාදානය, ප්‍රීතිය, ස්වාමී වූ යේසුස් වහන්සේ තුළ වර්ධනය කරනු ලබයි.

ඒ හා සමානවම ශුද්ධ වූ ආලේපයේ යහපත්කම තුළ ආත්මයේ බලය මත බුද්ධියට බලපෑමක් ඇති කළ හැකිය. එය මනසට ඥානය ලබාදෙනවා සහ එය වේගවත් කරනවා ඇත. ආත්මයාණන් වහන්සේගේ ඉගැන්වීම කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේව අවබෝධ කරගන්නා තෙක් මනුෂ්‍යයන්ගේ ඥානය අඳුරුව, ශාරීරික ශක්තිය සුවඳක් ප්‍රකාශ නොකරන තත්ත්වයේ පවතියි. එයින් දෙවියන් වහන්සේව අවබෝධ කරගත නොහැකිය. ඒ අනුව සැකයක් නොමැතිව ආත්මයාණන් වහන්සේගේ ඉගැන්වීම කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේව අවබෝධ කරගැනීම අපට යොදාගත හැකිය. බලවත් වූ දෙවියන් වහන්සේව දැන ගැනීම මනුෂ්‍යයාගේ අරමුණ විය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ, සැබෑ වූ දෙවියන් වහ්සේව අනාවරණය කරන සේක. එබැවින් දෙවියන් වහන්සේව දැන ගැනීමට අපි නියමාකාරයෙන් සහ සම්පූර්ණයෙන්ම යේසුස් වහන්සේව දැනගත යුතුය. යම් කෙනෙක් ක්‍රිස්තුස් වහන්සේගේ පාමුල යටහත් වූ ශිෂ්‍යයෙක් වන්නේ නම් ඔහුගේ බුද්ධිය, බලය සීමාසහිත වුවත්, ඔහු ප්‍රඥාවත්, බලයත්, දෙවියන් වහන්සේගේ යහපත්කමත් සැබවින්ම බොහෝ සේ දැනගනු ලබනවා ඇත. තාරකා විද්‍යාඥයින් ඉගෙන ගන්නවාට වඩා දර්ශනවාදීන්ගේ මහත් වූ දැනුමට වඩා එසේ නැති නම් ප්‍රඥාවන්තයන්ගේ මුළු ප්‍රඥාවට වඩා මැවිල්ල පිළිබඳව පර්යේෂණ කරන අයගේ සීමාසහිත දැනුම් පරාසයට වඩා ක්‍රිස්තුස් වහන්සේගේ පාමුල යටහත්ව සිටින්නා වූ අය දෙවියන් වහන්සේ ගැන දැනගන්නවා ඇත. එම නිසා ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තියෙහි බලවත්වී දෙවියන් වහන්සේව දැනගෙන ජයග්‍රහණය වර්ධනය කරගන්න. පවිත්‍රවෙන්න. ප්‍රාඥාවන්තයෙක් බවට පත්වෙන්න. (ශ්‍රේෂ්ඨත්වයට පත්වෙන්න.)

නිශ්චලව සහ සැනසිල්ලේ ඔබගේ හදවතට ඇහුම්කන්දීමට ඔබට පුළුවන්ද .. ? ක්‍රිස්තුස් වහන්සේගේ මනුෂ්‍යය දයානුකම්පාව සමඟ සමීපවීමට එය රැගෙන එන්න. ඔබගේ මනස විශාල කර වැඩි දියුණු කරගන්න. විශ්වාසය තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය පුද්ගලිකත්වය සමඟ සම්බන්ධවීමට එය රැගෙන එන්න. ඉතාම උසස් තත්ත්වයෙන් සහ බොහෝ අනර්ඝ ලෙස යේසුස් වහන්සේව අවබෝධ කරගන්න. නැතිවුනා වූ සියලු දේවලට වඩා ක්‍රිස්තුස් වහන්සේව දැන ගැනීම යහපත් බව පාවුල්තුමා පවසන්නේය. යේසුස් වහන්සේව ගැලවුම්කරුවාණන් ලෙස හඳුනාගැනීම, අපගේ මිතුරා ලෙස හඳුනා ගැනීම, අපගේ සහෝදරයා ලෙස හඳුනාගැනීම, අපගේ මැදහත්කරුවාණන් සහ අපගේ අයිතිකාරවාණන් ලෙස හඳුනාගැනීම කරුණුකොටගෙන **"සදාකාල ජීවනය සහ තේජස අත්දැකිය හැකිය. සදාකාල ජීවනය නම් මෙය, එකම සැබෑ වූ දෙවියන් වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිගැනීමය."** (යොහාන් 17:3)

මෙම ආලේපයේ සුවඳ ශුද්ධකම උගන්වන අතර ඇඳහිලිවන්තයාගේ යාච්ඤා කිරීම් දිව්‍යමය ලෙස පිළිගත හැකි මිහිරි සුවඳක් වන්නේය. අයැද සිටීම කොපමණ පුදුමද .. ? කරුණාවේ සිංහාසනය ඉදිරියේ අයැද සිටීමෙන් කථාවේ චතුර බවේ ස්පර්ශය ලබාදීම සහ ඔබගේ තොල්වල වචන සතුටින් ඉපිලී යන තත්ත්වයේ පැවතීම යටතේ ඉහළින් පැමිණෙන සුවඳින් දේවමාළිගාව පිරීයනවාද .. ? යේසුස් වහ්සේගේ බලය කරුණුකොටගෙන පාපයෙන් (වරදින්) නිදහස්වීම යෝග්‍ය වන්නේය. ස්වර්ගයට ඔබගේ සියලු අයැදීම් සුවඳ ද්‍රව්‍ය මෙන් ගෙනයනු ලබන්නේය. **"නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත් පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමය ලබන පිනිස මම ඒක ඉෂ්ඨකරන්නෙමි. නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත් මම ඒක ඉෂ්ඨකරන්නෙමි."** (යොහාන් 14:13-14)

යේසුස් වහන්සේගේ නාමය තුළ ඇදහිල්ලේ බලයෙන් යුක්තව යාච්ඤාව ඔප්පු කරමු. එය ඔබගේ විශිෂ්ඨත්වය සඳහා නොවේ. මෙම ඉල්ලීම් දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ලබාදෙන සේක. ඉල්ලන්නාවූ දේ ලබා නොදී සිටීම ඔබගේ වරද නිසා නොව එය උන්වහන්සේගේ කැමැත්තයි. නමුත් උන්වහන්සේ ලබා දෙන්නා වූ සියලු දේ ක්‍රිස්තුස් වහන්සේට ගෞරවය ලබාදීම උදෙසා ඉටුකරන සේක. ඊළඟට වේදනාත්මක හදවතකින් කරුණාවේ සිංහාසනය වෙතට ළඟාවන්නෙමු. ඔබගේ ඇදහිල්ල තුළ සැබෑ සුවඳ දුම් ඔප්පු කරන්න. සිංහාසනය ඉදිරියේ රන් ප්‍රජාසනය මත සියලු ශුද්ධවන්තයන්ගේ යාච්ඤාවන් ඔප්පු කිරීම සුවඳ දුම් ඔප්පු කරන්නාක් මෙන් වේ. යේසුස් වහන්සේගේ නාමය තුළ ඔබගේ ආශිර්වාද ඉල්ලා සිටින විට වර්තාමන ඔබගේ පාපය ගැන පසුතැවිලි වී ආයාචනා කරන විට එය මිහිරි සුවඳක් මෙන් ස්වර්ගය වෙතට නැගී යන්නේය.

## වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සූදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

"සත්‍යතාවයෙන් ඔවුන් පවිත්‍ර කළ මැනව. ඔබගේ වචනය සත්‍යතාවය" (යොහාන් 17:17)